ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

கிழக்குப் பல்கலைக் கழகம், இலங்கை

EASTERN UNIVERSITY, SRI LANKA

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை - 2014

ANNUAL REPORT

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

වාර්ෂික වාර්තාව - 2014

පටුව

1.	දැක්ම	-	01
2.	මෙහෙවර ප්‍රකාශය	-	01
3.	උප කුලපති තුමාගේ සමාලෝචනය	-	01
4.	සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර:	-	09
5.	දේශීය සිසුන් පිළිබඳ විස්තර	-	10
6.	විදේශීය සිසුන් පිළිබඳ විස්තර	-	11
7.	අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර	-	11
8.	අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර	-	12
9.	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	-	13
10.	වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර	-	15
11.	ලබාගත් සම්මාන පිළිබඳ විස්තර	-	17
12.	අළුතින් ආරම්භ කරන ලද පාඨමාලාවන් පිළිබඳ විස්තර	-	18
13.	පුනරාවර්තන වියදම් පිළිබද විස්තර	-	18
14.	ප්‍රාග්ධන වියදම් පිළිබද විස්තර	-	19
15.	ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)	-	19
16.	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)	-	21
17.	මූල්‍ය ප්‍රගතිය පළිබඳ විස්තර (වියදම්)	-	22
18.	මුල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම)	-	23
19.	මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2014:	-	23
20.	2014 වර්ෂය තුල ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර	-	24
21.	වෙනත් විස්තර / මෙම වාර්තාවට අදාල ක්‍රියාකාරිත්වය	-	25
22.	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවග	-	26
23.	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාලව කළමනාකරණයේ හේතු පැහැදිලි කිරීම	-	41

1. දැක්ම

ප්‍රාදේශීය සහ ගෝලීය තත්වයන්ගේ වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්විය හැකි, උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ යන අංශවල තරගකාරී වාසියක් ලබාගත හැකි, විශිෂ්ඨ වූ ජාතික මට්ටමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම ; ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අභිප්‍රායයි.

2. මෙහෙවර ප්‍රකාශය

ඉගෙනීම හා පර්යේෂණ භාවිතය ධෛර්යමත් කරමින්, ප්‍රජා සුභසාධනය, සෞභාග්‍යය සහ සංස්කෘතිය වැඩිදියුණු කිරීම මෙන්ම අපේක්ෂිත ජයග්‍රාහී ඉලක්කයන් සාර්ථකව ලගා කර ගැනීම සඳහා සම්පත් සුරක්ෂිත කර ගැනීම සහ ඒවා කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා, පර්යේෂණ හා ශිෂ්‍යත්ව යන අංශයන්හි විශිෂ්ඨත්වය ලගා කර ගැනීම වෙනුවෙන් එය සතු අභ්‍යන්තර සහ බාහිර පීඨයන්, මණ්ඩපය සහ අනෙකුත් පහසුකම් හරහා, ප්‍රතිලාභ ලබා ගත හැකි, සෑම දෙනා සඳහාම අධ්‍යාපනය සහ පුහුණුවීම යන අංශයන්හි අනගිභවනීය අවස්ථා ලබාදීම ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අපේක්ෂාවයි.

3. උප කුලපති තුමාගේ සමාලෝචනය

(අ) විශ්වවිද්‍යාලය පිළිබඳව සංක්ෂිප්ත හඳුන්වාදීම

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය, 1981 අගෝස්තු මස 01 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා හා කෘෂිකර්ම යන පීඨ දෙකක් සහිතව මඩකලපුවේ විශ්වවිද්‍යාල විදුහල නමින් ආරම්භ කර ඇත. 1980 ඔක්තොම්බර් මාසයේදී වාණිජ හා කළමනාකරණ පීඨය සහ කලා හා සංස්කෘත පීඨය යන අතිරේක පීඨයන්ගෙන් සමන්විතව මෙම විශ්වවිද්‍යාල ආයතනය සියළු සුදුසුකම් ඇති විශ්වවිද්‍යාලයක් ලෙස උසස් කරන ලදි. මානව ජීව විද්‍යා, අතිරේක සෞඛ්‍ය විද්‍යා, ව්‍යාධි භෞතික විද්‍යා, වෛද්‍ය අධ්‍යාපන හා පර්යේෂණ, රසායනික විද්‍යා සහ ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ යන අධ්‍යනාංශ හයකින් සමන්විතව 2006 වර්ෂයේදී සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය ස්ථාපිත කරන ලදි.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය, සන්නිවේදන සහ ව්‍යාපාර අධ්‍යයන පීඨය සහ ව්‍යවහාර විද්‍යා පීඨය යන පීඨ දෙකකින් සමන්විතව 2001 ජූනි මස 15 දින ස්ථාපිත කරන ලද අතර දැනට දේශීය වෛද්‍ය ඒකකයක්ද ස්ථාපිත කර ඇත.

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය (ස්.වි.සෞ.අ.ආ) 2005 මාර්තු මස 01 වන දින සිට නැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධ කර ඇත. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීමට පෙර එය ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යාලය ලෙස හඳුන්වන ලද අතර මුලදී එය ප්‍රාදේශීය කටයුතු හා හින්දු සංස්කෘතික අමාත්‍යාංශය යටතේත් පසුව සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේත් 1981 ස්ථාපිත කිරීමෙන් පසුව පාලනය කරන ලදි.

පීඨ සහ පාඨමාලාවන් :

- විද්‍යා පීඨය දෙපාර්තමේන්තු පහකින් සමන්විත වන අතර එමගින් ජීව විද්‍යා විද්‍යාවේදී, භෞතික විද්‍යා විද්‍යාවේදී, විද්‍යා අධ්‍යාපන විද්‍යාපති සහ දර්ශනපති හා දර්ශනශූරී පර්යේෂණ උපාධි ප්‍රදානය කරනු ලබයි.

- කෘෂි විද්‍යා පීඨය දෙපාර්තමේන්තු හයකින් සමන්විත වන අතර එමගින් කෘෂිකර්ම විද්‍යාවේදී සහ කෘෂිකර්ම විද්‍යාපති උපාධි ප්‍රදානය කරනු ලබයි.

- කලා හා සංස්කෘත පීඨය දෙපාර්තමේන්තු නවයකින් සමන්විත වන අතර එමගින් ශාස්ත්‍රවේදී, අධ්‍යාපනවේදී, අධ්‍යාපනපති, දර්ශනපති හා දර්ශනශූරි උපාධි පාඨමාලාවන් ප්‍රදානය කරනු ලබයි.

- වාණිජ හා කළමණාකරන පීඨය දෙපාර්තමේන්තු තුනකින් සමන්විත වන අතර එමගින් වාණිජවේදී, ව්‍යාපාර පරිපාලනවේදී, කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පී.ජී.ඩී.එම්.), ව්‍යාපාර පරිපාලනපති (එම්.බී.ඒ.), සහ සංවර්ධන ආර්ථික විද්‍යාවේදී (එම්.ඩී.ඊ.) උපාධි පාඨමාලාවන් ප්‍රදානය කරනු ලබයි.

- සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය දෙපාර්තමේන්තු හයකින් සමන්විත වන අතර එමගින් වෛද්‍යවේදී උපාධිය (එම්.බී.බී.එස්.) හා විද්‍යාවේදී හෙද උපාධිය පිරිනමනු ලබයි.

- ත්‍රිකුණාමල මණ්ඩපය, සන්නිවේදනය හා ව්‍යාපාර අධ්‍යයනය සහ ව්‍යවහාරික විද්‍යාව නමින් පීඨ දෙකකින් සහ දේශීය වෛද්‍ය ඒකකයකින් සමන්විත වන අතර එමගින් ගණකාධිකරණය හා මූල්‍ය කළමණාකරණ විද්‍යාවේදී, භාෂා හා සන්නිවේදන අධ්‍යයන ශාස්ත්‍රවේදී, පරිගණක විද්‍යා විද්‍යාවේදී, තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී සහ දේශීය වෛද්‍ය හා සැත්කම් පිළිබඳ විද්‍යාවේදී උපාධි පිරිනමනු ලබයි.

- බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය : වැඩිපුර ශිෂ්‍යයන් පිරිසකට විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අවස්ථාව ලබාදීමේ අරමුණින් පීඨයන් මගින්ද බාහිර උපාධි පාඨමාලා පිරිනමනු ලබයි. මෙම පාඨමාලා බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය මගින් කළමනාකරණය කරනු ලබයි.

(ආ) ජයග්‍රහණ

- **ජාත්‍යන්තර සමුළුව** : 3 වන ජාත්‍යන්තර සමුළුව, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උප කුලපති තුමාගේ ප්‍රධානත්වයෙන් 2014 දෙසැම්බර් මස 04 වැනි දින පැවැත්වුණි. මෙම සමුළුවේ තේමාව වූයේ ''**නවෝත්පාදන තුලින් කල් පවත්නා සංවර්ධනය**'' යන්නයි. මෙම සමුළුව ආචාර්ය එම්. රවී මයාගේ සම ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ආචාර්ය ටි. බවන්, ආර්. තිවියදර්ශන් මයා, ආර්. කිරුපරාජා මයා යන අය ලේකම්වරු ලෙස කටයුතු කරන ලදි.

  ''දැනුම පදනම් වූ ආර්ථිකයක නව රුකියා සංවර්ධනය තුලින් කල් පවත්නා සංවර්ධනය'' යන මැයෙන් වූ ප්‍රධාන දේශනය විද්‍යාජෝති මයා විසින් සිදුකරන ලද අතර විශ්‍රාම ලත් මහාචාර්ය දයන්ත එස්. විජේසේකර හා මදුරාසියේ කමරාජ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අයි. මුත්තයියා යන මහත්වරුන් ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වී මෙම අවස්ථාව වර්ණවත් කරන ලදි.

  පහත විෂයය ක්ෂේත්‍රවලට අදාලව පර්යේෂකයන්ගෙන් පර්යේෂණ පත්‍ර ඇරයුම් කරන ලදි.

  - කෘෂිකර්මය, ආහාර හා පෝෂණය
  - ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණය
  - ව්‍යාපාර හා ව්‍යවසායකත්වය
  - කාලගුණ වෙනස්වීම් හා පරිසරය
  - සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා
  - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා

  සමුළුවේදී පර්යේෂණ පත්‍ර 61 ක් එළි දක්වන ලද අතර පර්යේෂණ වලට අදාලව අර්ථවත් සාකච්ඡා , අත්දැකීම් හා අභියෝග සහභාගී වුවන් අතර හුවමාරු කරගන්නා ලදි.

- විද්‍යා සටහන් කිරීමේ දර්ශකය ඇතුලත් කරනු ලබන ජාත්‍යන්තර විද්‍යාත්මක සඟරාවන්හී විද්‍යාත්මක ප්‍රකාශන සඳහා වන ජනාධිපති සම්මානය විද්‍යා පීඨයේ ජේෂ්ඨ ආචාර්යයවරුන් හතර දෙනෙකු හා කෘෂිකර්ම පීඨයේ ආචාර්යවරයෙකු විසින් ලබා ගන්නා ලදි. මෙම සම්මාන ශ්‍රී ලංකාවේ ලිපිනයක් සහිතව අවම වශයෙන් එක් ලේඛකයකුගේ නම විද්‍යා සටහන් කිරීමේ දර්ශකයේ ඇතුලත් 2007 , 2008 සහ 2009 වර්ෂයන්හි ප්‍රකාශන සඳහා ලබා දෙන ලදි. මෙම සම්මාන උළෙල,ජාතික පර්යේෂණ සභාව විසින් 2014 ජනවාරි 17 වන දින ග්‍රෑන්ඩ් බෝල්රූම්,වෝටර්ස් එජ්,බත්තරමුල්ල යන ස්ථානයේදී පවත් වන ලදි.

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ආචාර්යයවරුන් විසින් 2014 වර්ෂයේදී විද්‍යා සටහන් කිරීමේ දර්ශකයේ ඇතුලත් කරන ලද ප්‍රසිද්ධ ජාත්‍යන්තර සඟරාවන්හි පර්යේෂණ ලිපි හතරක් ප්‍රකාශයට පත්කරන ලදි.

- හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කලා හා සංස්කෘත පීඨය , වාණිජ හා කළමණාකරණ පීඨය සහ පුස්තකාලය සඳහා අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලි සහ නව ප්‍රවේශ මාර්ගය 2014 අප්‍රේල් මස 19 වැනි දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදි.

- 18 වන උපාධි ප්‍රධානෝත්සවය , 2014 අප්‍රේල් මස 05 වන දින පවත්වන ලද අතර එහිදී උපාධිලාභීන් 767 දෙනෙකු සිය උපාධි තහවුරු කරගන්නා ලදි.

- නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වෙබෝමෙට්‍රික් (Webometric) දර්ශකයට අනුව 970 කින් වර්ධනය විය. (2013 ජූලි මසදී 12,124 ස්ථානය හිමි වූ අතර එය 2014 ජූලි මාසයේදී 11,154 විය)

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා නාවික හමුදාව යන දෙපාර්ශවය අතර උසස් අධ්‍යාපනයෙන් ලැබෙන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ වර්ධනය කරගැනීම සඳහා අවබෝධතා ගිවිසුමක් 2014 ජනවාරි මස 17 වන දින ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේදී අත්සන් කරන ලදි.

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය හා රුහුණු විශ්වවිද්‍යාලය , ශ්‍රී ලංකාව අතර දෙපාර්ශවය වෙත උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ වලින් ලැබෙන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ වර්ධනය කරගැනීම සඳහා අවබෝධතා ගිවිසුමක් 2014 ඔක්තොම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේදී අත්සන් කරන ලදි.

- **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය**

  I. සමස්ථ විශ්වවිද්‍යාලය සඳහාම (ප්‍රධාන පරිශ්‍රය) රැහැන් රහිතව wi-fi (wi-fi LAN) පද්ධතියක් ස්ථාපිත කිරීම.
  II. ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - 2014 (ICE - 2014) සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම.
  III. අන්තර්ජාල ධාරිතාවය තත්පරයට මෙගාබයිට් 5 (5 Mbps) සිට මෙගාබයිට් 36 (36 Mbps) දක්වා වැඩි කිරීම.
  IV. 2 වන ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපනය නැමැති ව්‍යාපෘතියේ (HETC) ආධාර මත UCTIT විභාගයට සූදානම් වන සිසුන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
  V. සිසුන් සඳහා අන්තර්ජාලය හරහා UCTIT විභාගය පැවැත්වීම.
  VI. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඉගෙන්වීම් කළමනාකරණ පද්ධතියක් (LMS) හඳුන්වා දීම හා අධ්‍යයන කාර්යය මණ්ඩලය මෙම පද්ධතිය සම්බන්ධයෙන් පුහුණු කිරීම සඳහා වැඩමුළු කිහිපයක් පැවැත්වීම.

- 2014 ජූලි 17 වන දින අධ්‍යාපනපති උපාධිය සඳහා අනුමැතිය ලබා ගැනීම.

- දේශන ශාලා වලින් 85% සඳහා බහු මාධ්‍යය ප්‍රක්ෂේපන යන්ත්‍ර ලබා දීම.

- ඉගෙනුම් සහ ඉගැන්වීම් සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් ලබා දීම.
- විද්‍යුත් ඉගෙනුම් සම්පත් ස්ථාපිත කිරීම.
- සියළුම උපාධි පාඨමාලා සඳහා අතුරු නීති සකස් කිරීම මේවන විටත් අවසන් මට්මමේ පවතී.
- අවසන් ගිණුම් නියමිත කාලය තුලදී ඉදිරිපත් කිරීම.
- සමාලෝචිත වර්ෂය තුලදී බාහිර විගණන ගිවිසුම් කිසිවක් ඉදිරිපත් නොවීම.

- **ක්‍රීඩා ක්‍රියාකාරකම් :**

(අ) මොරටුව විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලද ජාතික ආරාධිත විශ්වවිද්‍යාල තරගාවලිය - 2014 ට සහභාගී වී පහත ජයග්‍රහණ ලබාගෙන ඇත.

ඉසව්ව	ස්ථානය
බාස්කට්බෝල් (කාන්තා)	ශූරතාවය
බාස්කට්බෝල් (පිරිමි)	අනුශූරතාවය
පාපන්දු	අනුශූරතාවය

(ආ) **ජෙනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක** විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලද ජාතික ආරාධිත විශ්වවිද්‍යාල තරගාවලිය - 2014 ට සහභාගී වී පහත ජයග්‍රහණ ලබාගෙන ඇත.

ඉසව්ව	ස්ථානය
බාස්කට්බෝල් (කාන්තා)	ශූරතාවය
බාස්කට්බෝල් (පිරිමි)	අනුශූරතාවය
පාපන්දු	තෙවන

(ඇ) අන්තර් විශ්වවිද්‍යාල තරගාවලිය - 2014 ට සහභාගී වී පහත ජයග්‍රහණ ලබාගෙන ඇත.

ඉසව්ව	ස්ථානය
බාස්කට්බෝල් (පිරිමි)	ශූරතාවය
රෙස්ලින්	අනුශූරතාවය
පාපන්දු	තෙවන
බාස්කට්බෝල් (කාන්තා)	සිව්වන

- **යටිතල පහසුකම් සංවර්ධනය**

i. ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම්

අනු අංකය	ව්‍යාපෘතියේ නම	මුළු පිරිවැය (රු.මි. වලින්)	වර්තමාන තත්වය
1.	කලා හා සංස්කෘතික පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	121	අතිගරු ජනාධිපතිතුමා විසින් 2014.04.19 දින උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබූ අතර ගොඩනැගිල්ල දැනට භාවිත කරමින් පවතී
2.	පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	171	අතිගරු ජනාධිපතිතුමා විසින් 2014.04.19 දින උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබූ අතර ගොඩනැගිල්ල දැනට භාවිත කරමින් පවතී
3.	වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	230	අතිගරු ජනාධිපතිතුමා විසින් 2014.04.19 දින උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබූ අතර ගොඩනැගිල්ල දැනට භාවිත කරමින් පවතී
4.	මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	299	33% ක් නිම කර ඇත
5.	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා මඩකලපුවේ පිල්ලයාරඩි හි ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	360	24% ක් නිමකර ඇත
6.	කලා හා සංස්කෘත පීඨය සඳහා ශ්‍රවණාගාරයක් හා දේශන ශාලාවක් ඉදිකිරීම	44.6	82% ක් නිම කර ඇත

ii. නේවාසිකාගාර ව්‍යාපෘති (ස්ථිර)

අනු අංකය	ව්‍යාපෘතියේ නම	මුළු පිරිවැය (රු.මි. වලින්)	වර්තමාන තත්වය
1.	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සුනාමි පුනරුත්තාපන ව්‍යාපෘතිය යටතේ චන්දාරමුලෙයි පරිශ්‍රය තුල පිරිමි සිසුන් 200 දෙනෙකු සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	182.0	වැඩ නිමකර ඇති අතර සිසුන් විසින් ප්‍රයෝජනයට ගනු ලබයි
2.	උසස් අධ්‍යාපන අමාත්‍යංශය යටතේ චන්දාරමුලෙයි පරිශ්‍රය තුල පිරිමි සිසුන් 200 දෙනෙකු සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	220.0	වැඩ නිමකර ඇති අතර සිසුන් විසින් ප්‍රයෝජනයට ගනු ලබයි
3.	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මඩකලපුවේ, පිල්ලයාරඅඩි හි පිහිටි සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා කාන්තා සිසුන් 200 දෙනෙකු සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	220.0	වැඩ නිමකර විවෘත කිරීමේ අපේක්ෂාවෙන් පසුවේ

iii. අතිරේක සිසුන් බඳවා ගැනීම යටතේ පහත සඳහන් අර්ධ ස්ථිර නේවාසිකාගාර ගොඩනැගිලි නිමකරන ලදි.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	මුළු පිරිවැය (රු.මි. වලින්)	වර්තමාන තත්වය
1.	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ කාන්තා සිසුන් 80 දෙනෙකු සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම.	19.5	භාවිතා කරමින් පවතී.
2.	පිරිමි සිසුන් 100 දෙනෙකු සඳහා ශ්‍රී.ලං.නැ. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ නේවාසිකාගාරයක් ඉදිකිරීම.	19.5	භාවිතා කරමින් පවතී.
3.	කාන්තා සිසුන් 100 දෙනෙකු සඳහා ශ්‍රී.ලං.නැ. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ නේවාසිකාගාරයක් ඉදිකිරීම.	19.5	භාවිතා කරමින් පවතී.
4.	ICC නේවාසිකාගාරය - අදියර II	-	-

iv. ක්‍රීඩා සඳහා ගොඩනැගිලි සංකීර්ණයක්:

රුපියල් මිලියන 19.5 ක වියදමින් ව්‍යායාම ශාලා ගොඩනැගිල්ලක වැඩ නිමවා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය වෙත භාරදීමට කටයුතු කර ඇත.

v. ගොඩනැගිලි අළුත්වැඩියාකිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය.

පහත ප්‍රධාන වැඩිදියුණු කිරීමේ කාර්යයන් 2014 වර්ෂය තුලදී සිදුකරන ලදි.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	මුළු පිරිවැය (රු.මි. වලින්) (වැට් බදු සමග)	වර්තමාන තත්වය
1.	ශ්‍රී.ලං.නැ. විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා අඩක් නිමකරන ලද ගොඩනැගිල්ලේ කටයුතු (අදියර) අවසන් කිරීම.	36.96	99% ක් නිමකර ඇත.
2.	ශ්‍රී.ලං.නැ. විශ්වවිද්‍යාලයේ නව පරිශ්‍රයේ පිවිසුම් දොරටුව සහ අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම.	29.60	60% ක් නිමකර ඇත.
3.	ශ්‍රී.ලං.නැ. විශ්වවිද්‍යාලයේ මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ කායච්ඡේද විද්‍යාගාරය දිගු කිරීම.	5.32	100% ක් නිමකර ඇත.
4.	ශ්‍රී.ලං.නැ. විශ්වවිද්‍යාලයේ මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ආපන ශාලාව දිගු කිරීම.	3.20	85% ක් නිමකර ඇත.
5.	ශ්‍රී.ලං.නැ. විශ්වවිද්‍යාලයේ මඩකලපුවේ දැනට පවතින ප්‍රධාන ආපන ශාලාව අළුත්වැඩියා කිරීම හා දිගු කිරීම.	11.76	40% ක් නිමකර ඇත.
6.	වන්දාරමුලෙයිහි පිහිටි ප්‍රධාන විශ්වවිද්‍යාලයේ කාන්තා නේවාසිකාගාරයේ නව කොටස අළුත්වැඩියා කිරීම.	15.35	99% ක් නිමකර ඇත.
7.	වන්දාරමුලෙයිහි පිහිටි ප්‍රධාන විශ්වවිද්‍යාලයේ හා මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම.	4.08	10% ක් නිමකර ඇත.

vi. නව ඉදිකිරීම් ව්‍යාපෘති යෝජනාවන්:

- කෘෂිකර්ම පීඨය සඳහා රුපියල් මිලියන 303 ක පිරිවැයක් වන ගොඩනැගිලි සංකීර්ණයක් අනුමත කර ඇත.
- ඉංග්‍රිසි ඉගැන්වුම් ඒකකය සඳහා රුපියල් මිලියන 275 ක පිරිවැයකින් යුත් ගොඩනැගිල්ලක් අනුමත කර ඇත.

(ඇ) අනාගත සැලසුම්

- නව පීඨ ස්ථාපිත කිරීම

    (අ) ඉංජිනේරු පීඨය

    (ආ) ගමනා ගමන, සංචාරක හා ආගන්තුක සත්කාර පීඨය

    (ඇ) ක්ෂීර විද්‍යා හා තාක්ෂණ පීඨය

    (ඈ) හින්දු ශිෂ්ඨාචාර පීඨය

    (ඉ) නාවික ඉංජිනේරු තාක්ෂණ පීඨය (ත්‍රිකුණාමල මණ්ඩපයෙහි)

- දේශීය වෛද්‍ය ඒකකය ලෙස දැනට ක්‍රියාත්මක වන ඒකකය, අධ්‍යයනාංශයක් ලෙස වැඩිදියුණු කිරීම.

- ත්‍රිකුණාමල මණ්ඩපයේ සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය කොටස් දෙකකට වෙන්කිරීම.

- ඉස්ලාම් හා අරාබි අධ්‍යාපනය ඇතුළුව සියළුම පාඨමාලාවන් සඳහා විශේෂවේදී උපාධි ආරම්භ කිරීම.

- පහත මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.

    (අ) කෘෂි තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය

    (ආ) ද්‍රව්‍ය විද්‍යා හා නැනෝ තාක්ෂණය පිළිබඳ මධ්‍යස්ථානය

    (ඇ) කැනඩාවේ රයර්සන් විශ්වවිද්‍යාලයේ උපකාර ඇතිව ත්‍රිමාණ මුද්‍රණ විද්‍යාගාරයක්

- ඉංග්‍රීසි ඉගැන්නුම් ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක්

- සිසුන් හා කාර්ය මණ්ඩලයේ විනෝදාත්මක හා ක්‍රීඩා පහසුකම් සඳහා මහල් කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

- කාර්ය මණ්ඩලය සඳහා විනෝදාත්මක හා ක්‍රීඩා පහසුකම්.

4. සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර:

පීඨය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය				
කලා හා සංස්කෘත	කලා හා සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී	1489	54	21
කෘෂිකර්මය	කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය	299	28	34
වනිජ හා කළමණාකරණ	ව්‍යාපාර පරිපාලනවේදී	466	21	14
	වානිජවේදී	447		
සෞඛ්‍ය ආරක්ෂණ	වෛද්‍යවේදී	299	25	29
	වෛද්‍යවේදී(හෙද)	87		
විද්‍යා	විද්‍යාවේදී (ජීව)	367	29	29
	විද්‍යාවේදී (භෞතික)	356		
එකතුව		**3810**	**157**	**127**
ත්‍රිකුණාමල මණ්ඩපය				
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය	විද්‍යාවේදී (ගණකාධිකරණ හා මූල්‍ය කළමණාකරණය)	335	16	02
	ශාස්ත්‍රවේදී (භාෂා හා සන්නිවේදන අධ්‍යයනය)	204	08	02
ව්‍යවහාරික විද්‍යාව	පරිගණක විද්‍යාවේදී	10	06	03
දේශීය වෛද්‍ය ඒකකය	දේශීය වෛද්‍ය හා සැත්කම් පිළිබඳ විද්‍යාවේදී	108	06	01
එකතුව		**657**	**31**	**07**

5. දේශීය සිසුන් පිළිබඳ විස්තර:

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	බඳවාගැනීම් 2014	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තුන්වන වසර සිසුන්	හතරව න වසර සිසුන්	පස්වන වසර සිසුන්	උපාධිධා රි සංඛ්‍යාව
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය									
කලා හා සංස්කෘත	කලා හා සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී	දෙමළ	450	276	543	261	253	-	311
කෘෂිකර්මය	කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය	ඉංග්‍රිසි	120	83	65	73	42	-	22
වාණිජ හා කළමණාකරණ	ව්‍යාපාර පරිපාලනවේදී	ඉංග්‍රිසි	100	104	105	105	88	-	42
	වාණිජවේදී	ඉංග්‍රිසි	100	97	75	94	75	-	39
සෞඛ්‍ය ආරක්ෂණ	වෛද්‍යවේදී	ඉංග්‍රිසි	60	58	75	50	51	32	37
	වෛද්‍යවේදී (හෙද)	ඉංග්‍රීසි	30	22	26	26	9	04	5
විද්‍යා	විද්‍යාවේදී (ජීව)	ඉංග්‍රිසි	150	118	83	114	38	-	13
	විද්‍යාවේදී (භෞතික)	ඉංග්‍රිසි	150	96	68	133	49	-	21
එකතුව			**1160**	**854**	**1040**	**856**	**605**	**36**	**490**
ත්‍රිකුණාමල මණ්ඩපය									
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය	විද්‍යාවේදී (ගණකාධිකරණ හා මූල්‍ය කළමනාකරණ)	ඉංග්‍රිසි	85	66	113	66	37	-	53
	ශාස්ත්‍රවේදී (භාෂා හා සන්නිවේදන අධ්‍යනය)	ඉංග්‍රීසි	66	38	60	49	08	-	49
ව්‍යවහාරික විද්‍යාව	පරිගණක විද්‍යාවේදී	ඉංග්‍රීසි	08	-	-	-	-	-	10
	භෞතික විද්‍යාවේදී	ඉංග්‍රිසි	24	-	-	-	-	-	-
දේශීය වෛද්‍ය ඒකකය	දේශීය වෛද්‍ය හා සැත්කම් පිළිබඳ විද්‍යාවේදී	ඉංග්‍රීසි	51	22	25	15	13	16	17
එකතුව			**234**	**126**	**198**	**130**	**58**	**16**	**129**

6. විදේශීය සිසුන් පිළිබඳ විස්තර : වර්ෂය තුල කිසිදු විදේශීය ශිෂ්‍යයකු ඇතුලත් කරගනු ලැබ නැත.

7. අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර:

(අ)ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

පීඨය	විෂයය	මාධ්‍යය	ජ්‍යේෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය /ආශ්‍රිත මහාචාර්ය	ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්යය (පුහුණු)	උපදේශක / බාහිර කාර්යය මණ්ඩලය
කලා හා සංස්කෘත	අරාබි සන්සන්දනාත්මක ආගම් හා සමාජ සහජීවනය, අධ්‍යාපනය හා ළමාරක්ෂාව භූගෝල විද්‍යාව ඉතිහාසය භාෂා ක්‍රිස්තියානි ආර්ථික විද්‍යාව හින්දු ශිෂ්ඨාචාරය	දෙමළ/ ඉංග්‍රීසි	නැත	නැත	ජේ.ක - 28 ක. - 26	35
කෘෂිකර්මය	කෘෂි විද්‍යාව කෘෂි රසායන විද්‍යාව කෘෂි ආර්ථික විද්‍යාව කෘෂි ඉංජිනේරු විද්‍යාව සත්ව විද්‍යාව බෝග විද්‍යාව	ඉංග්‍රීසි	නැත	නැත	ජේ.ක - 23 ක. - 05	0
වාණිජ හා කළමනාකරණ	වානිජ්‍යය කළමනාකරණය ආර්ථික විද්‍යාව මානව සම්පත් කළමනාකරණය ව්‍යාපාර සංවර්ධනය අලෙවිකරණය ගිණුම්කරණය හා මූල්‍යය ව්‍යාපාර ආර්ථික විද්‍යාව සංවර්ධන ආර්ථික විද්‍යාව	ඉංග්‍රීසි	නැත	නැත	ජේ.ක - 20 ක. - 01	07
විද්‍යා	උද්භිත විද්‍යාව සත්ව විද්‍යාව භෞතික විද්‍යාව රසායන විද්‍යාව ගණිතය	ඉංග්‍රීසි	නැත	නැත	ජේ.ක - 18 ක. - 11	20
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය	මානව ජීව විද්‍යාව සායනික විද්‍යාව වෛද්‍ය අධ්‍යාපන හා පර්යේෂණ අතිරේක සෞඛ්‍ය විද්‍යාව ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණය	ඉංග්‍රීසි	නැත	නැත	ජේ.ක - 05 ක. - 20	76
එකතුව			නැත	නැත	**157**	**138**

ජේ.ක - ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ක. - කථිකාචාර්ය

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

පීඨය	දෙපාර්තමේන්තුව / ඒකකය	මාධ්‍යය	ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය (ආධුනික)	උපදේශක / බාහිර කාර්යය මණ්ඩලය
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය	කළමනාකරණ	ඉංග්‍රීසි	ජේ.ක. - 06, ක. - 06	04
	සන්නිවේදන	ඉංග්‍රීසි	ජේ.ක. - 01, ක. - 03	-
	භාෂා	ඉංග්‍රීසි	ජේ.ක. - 02, ක. - 02	-
ව්‍යවහාරික විද්‍යාව	පරිගණක විද්‍යාවේදී	ඉංග්‍රීසි	ක. - 05	01
	භෞතික විද්‍යාව	ඉංග්‍රීසි		
දේශීය වෛද්‍ය ඒකකය	-	ඉංග්‍රීසි	ජේ.ක. - 02, ක. - 04	-
එකතුව			**31**	**05**

ජේ.ක - ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ක. - කථිකාචාර්ය

8. අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර:

(අ)ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

පීඨ /අධ්‍යනාංශ / අංශ / ශාඛා / ඒකක	වඩා ජ්‍යේෂ්ඨ[1]	ජ්‍යේෂ්ඨ කාර්යය මණ්ඩලය[2]	කනිෂ්ඨ කාර්යය මණ්ඩලය[3]	සුළු සේවකයන්[4]
උපකුලපති කාර්යාලය, උපකුලපති බංගලාව	-	1	1	1
ලේඛකාධිකාරි කාර්යාලය	-	-	3	1
සනාථන මන්දිරය	-	1	1	1
පාලන අංශය	2	-	19	1
අභ්‍යන්තර විගණන ඒකකය	1	1	2	1
රුකියා මාර්ගෝපදේශන ඒකකය	-	-	-	-
අනධ්‍යයන / ආයතනික ශාඛාව	1	-	3	1
අධ්‍යයන / ආයතනික ශාඛාව	1	-	5	1
සැපයුම් අංශය	1	-	7	2
මූල්‍යාධිකාරි කාර්යාලය	2	2	0	2
කෘෂිකර්ම පීඨය	1	3	16	14
වාණිජ හා කළමනාකරණ පීඨය	1	-	7	6
විද්‍යා පීඨය	1	9	10	9
සෞඛ්‍ය ආරක්ෂණ පීඨය	1	1	20	7
කලා හා සංස්කෘත පීඨය	1	4	10	6
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය	-	-	2	1
ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ඒකකය	-	-	1	1
විභාග අංශය	1	2	9	2

බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා අංශය	-	-	3	1
පුස්තකාලය	1	-	9	1
සෞඛ්‍ය මධ්‍යස්ථානය	1	-	7	-
ශාරීරික අධ්‍යනාංශය	-	-	-	2
සුභසාධන අංශය	1	-	2	1
නඩත්තු දෙපාර්තමේන්තුව	1	-	8	16
නේවාසිකාගාරය	-	-	9	1
ආරක්ෂක කාර්යාලය	1	1	28	-
එකතුව	**19**	**25**	**182**	**79**

1. පරිපාලන හා විධායක මට්ටම 2. ජ්‍යේෂ්ඨ මාණ්ඩලික මට්ටම
3. ලිපිකාර හා අනුබද්ධ ශ්‍රේණි 4. ඉහත ශ්‍රේණි වලට පහළ

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

පීඨ /අධ්‍යනාඅංශ / අංශ / ශාඛා / ඒකක	වඩා ජ්‍යේෂ්ඨ[1]	ජ්‍යේෂ්ඨ කාර්යය මණ්ඩලය[2]	කනිෂ්ඨ කාර්යය මණ්ඩලය[3]	සුළු සේවකයන්[4]
මණ්ඩාපති කාර්යාලය	-	-	01	-
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය	-	02	04	-
ව්‍යවහාරික විද්‍යා පීඨය	-	-	01	01
දේශීය වෛද්‍ය ඒකකය	-	-	-	01
මුදල් අංශය	02	02	02	01
විභාග අංශය	-	01	01	01
මූලධන වැඩ	-	-	02	-
ආයතන අංශය	-	01	-	-
පාලන අංශය	-	05	03	01
පුස්තකාලය	-	03	-	02
සුභසාධන අංශය	-	-	01	-
එකතුව	**02**	**14**	**15**	**07**

9. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

1. කෘෂිකර්ම පීඨය			
විෂයය	**ප්‍රකාශිත**	**වානිජකරණය කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පර්යේෂණ සංඛ්‍යාව	34	-	28
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව	12	-	-
ඈ. පොත් සංඛ්‍යාව	03	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	12	-	28
ඊ. වෙනත්	-	-	-
එකතුව	**61**	**-**	**56**

2. කලා හා සංස්කෘත පීඨය			
විෂයය	**ප්‍රකාශිත**	**වානිජකරණය කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පර්යේෂණ සංඛ්‍යාව	43	-	40
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	04	-	04
ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව	02	-	02
ඈ. පොත් සංඛ්‍යාව	02	01	-
ඉ. ලිපි සංඛ්‍යාව	54	-	06
ඊ. වෙනත්	18	-	26
එකතුව	**123**	**01**	**78**
3. වාණිජ හා කළමණාකරණ පීඨය			
විෂයය	**ප්‍රකාශිත**	**වානිජකරණය කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පර්යේෂණ සංඛ්‍යාව	13	-	10
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව	03	-	01
ඈ. පොත් සංඛ්‍යාව	-	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	02	-	02
ඊ. වෙනත්	-	-	-
එකතුව	**18**	**-**	**13**
4. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය			
විෂයය	**ප්‍රකාශිත**	**වානිජකරණය කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පර්යේෂණ සංඛ්‍යාව	04	-	09
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව	01	-	-
ඈ. පොත් සංඛ්‍යාව	01	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**06**	**-**	**09**
5. විද්‍යා පීඨය			
විෂයය	**ප්‍රකාශිත**	**වානිජකරණය කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පර්යේෂණ සංඛ්‍යාව	15	-	02
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව	20	-	01
ඈ. පොත් සංඛ්‍යාව	01	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	09	-	02
ඊ. වෙනත්	-	-	-
එකතුව	**45**	**-**	**05**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	ප්‍රකාශිත	වානිජකරණය කරන ලද	ඉදිරිපත් කරන ලද
අ. පර්යේෂණ සංඛ්‍යාව	18	12	11
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව	-	-	01
ඈ. පොත් සංඛ්‍යාව	01	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	03	-	-
ඊ. වෙනත්	01	-	
එකතුව	**23**	**12**	**12**

10. වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර:

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

1. කෘෂිකර්ම පීඨය			
විෂයය	**සහභාගිවන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	01	-	-
ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	01	-	
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	01	-
ඊ. වෙනත්	25	-	06
එකතුව	**27**	**01**	**06**
2. කලා හා සංස්කෘත පීඨය			
විෂයය	**සහභාගිවන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	04	03
ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	30	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	01	01	-
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	03	03	-
එකතුව	**04**	**38**	**03**
3. වානිජ හා කළමනාකරණ පීඨය			
විෂයය	**සහභාගිවන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	01	02	-
ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	01	03
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	01	-	-
ඊ. වෙනත්	06	පැය 35	පැය 24/2
එකතුව	**08**	**-**	**-**

4. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය			
විෂයය	**සහභාගිවන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු)	-	-	-
එකතුව	-	-	-

5. විද්‍යා පීඨය			
විෂයය	**සහභාගිවන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	04	02	-
ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	06	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	38	-	01
එකතුව	**48**	**02**	**01**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

විෂය	සහභාගිවන ලද	සම්පූර්ණ කරන ලද	ඉදිරිපත් කරන ලද
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	01	-
ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත් (කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය)	-	01	-
එකතුව	**-**	**02**	**-**

11. ලබාගත් සම්මාන පිළිබඳ විස්තර:

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

1. කෘෂිකර්ම පීඨය			
විෂයය	**සම්මාන සංඛ්‍යාව**	**අධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව**	**සිසුන් සංඛ්‍යාව**
අ. දේශීය සම්මාන	01	01	-
ආ. ජාතික සම්මාන	02	02	-
ඇ. අන්තර්ජාතික සම්මාන	01	01	-
ඈ. වෙනත්	01	01	-
එකතුව	**05**	**05**	**-**
2. කලා හා සංස්කෘත පීඨය			
විෂයය	**සම්මාන සංඛ්‍යාව**	**අධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව**	**සිසුන් සංඛ්‍යාව**
අ. දේශීය සම්මාන	-	-	-
ආ. ජාතික සම්මාන	-	-	02
ඇ. අන්තර්ජාතික සම්මාන	-	-	-
ඈ. වෙනත්	-	-	02
එකතුව	**-**	**-**	**04**
3. වානිජ හා කළමනාකරණ පීඨය - නැත			
4. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය - නැත			
5. විද්‍යා පීඨය			
විෂයය	**සම්මාන සංඛ්‍යාව**	**අධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව**	**සිසුන් සංඛ්‍යාව**
අ. දේශීය සම්මාන	-	-	-
ආ. ජාතික සම්මාන	★15	06	-
ඇ. අන්තර්ජාතික සම්මාන	-	-	-
ඈ. වෙනත්	-	-	-
එකතුව	**15**	**06**	**-**

★ පර්යේෂණ ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන සහ ජාතික පර්යේෂණ සභාවේ සම්මාන

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු සම්මානයක් ලැබී නොමැත.

12. අලුතින් ආරම්භ කරන ලද පාඨමාලාවන් පිළිබඳ විස්තර:

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	සහතික පත්‍ර	ඩිප්ලෝමා	පශ්චාත් ඩිප්ලෝමා	පශ්චාත් උපාධි	දර්ශනපති	දර්ශනශූරි
කෘෂිකර්ම	-	-	-	01	-	-	-	-
එකතුව	**-**	**-**	**-**	**01**	**-**	**-**	**-**	**-**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	සහතික පත්‍ර	ඩිප්ලෝමා	පශ්චාත් ඩිප්ලෝමා	පශ්චාත් උපාධි	දර්ශනපති	දර්ශනශූරි
සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය	ශාස්ත්‍රවේදී - භාෂා (විශේෂවේදී)	ඉංග්‍රීසි	-		-	-	-	-

13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර:

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

විෂයය	2013 රු.	2014 රු.
අ. පෞද්ගලික පඩිනඩි	396,847,356.46	461,711,392.42
ආ. ගමන් වියදම්	2,315,579.01	1,357,775.31
ඇ. සැපයුම්	35,355,288.37	35,476,627.88
ඈ. නඩත්තු	15,809,210.32	16,788,011.24
ඉ. ගිවිසුම්ගත සේවා	85,324,073.61	89,439,349.62
ඊ. පර්යේෂණ සහ සංවර්ධන	327,996.00	34,000.00
උ. වෙනත්	30,390,702.94	37,386,655.81
එකතුව	**566,370,206.71**	**642,193,812.28**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	2013 රු.	2014 රු.
අ. පෞද්ගලික වේතන පඩිනඩි	56,232,276.33	68,418,072.25
ආ. ගමන් වියදම්	278,650.70	301,759.55
ඇ. සැපයුම්	9,744,711.24	10,489,239.72
ඈ. නඩත්තු	4,108,998.37	3,226,086.60
ඉ. ගිවිසුම්ගත සේවා	38,483,676.25	42,805,177.64
ඊ. වෙනත්	6,972,481.32	6,175,139.00
එකතුව	**115,820,794.21**	**131,415,474.76**

14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තරː

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

විෂයය	2013 රු.	2014 රු.
අ. ලීබඩු හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම්	39,559,284.41	79,728,120.52
ආ. යන්ත්‍ර උපකරණ අත්පත් කර ගැනීම්	-	1,836,609.60
ඇ. ගොඩනැගිලි හා සැලසුම් අත්පත් කර ගැනීම්	346,530,114.84	348,301,357.95
ඈ. වෙනත්	70,292,573.29	74,466,565.69
එකතුව	**456,381,972.54**	**504,332,653.76**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	2013 රු.	2014 රු.
අ. ලීබඩු හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම්	22,656,554.66	11,062,844.72
ආ. වාහන අත්පත් කර ගැනීම්	299,040.00	104,564.00
ඇ. පොත් හා වාර සඟරා අත්පත් කර ගැනීම්	4,163,616.64	2,931,851.46
ඈ. තොරතුරු තාක්ෂණ සංවර්ධනය	165,000.00	-
ඉ. ක්‍රීඩා භාණ්ඩ	36,695.00	695,780.24
ඊ. ගොඩනැගිලි හා සැලසුම් අළුත්වැඩියා කිරීම්	25,370,300.68	45,477,756.60
උ. කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම්	-	375,196.42
එකතුව	**52,691,206.98**	**60,647,993.44**

15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

නම සහ විස්තරය	ණය / ආධාර	අරමුදල් සම්පාදිත ආයතනය #	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු. මිලියන)	ආපසු ගෙවනු ලබන විදේශාධාර(රු. මිලියන)	දේශීය අරමුදල් (රු. මිලියන)
ස්ථිර ගොඩනැගිලි					
කලා හා සංස්කෘත පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	121.00	-	121.00
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා පිරිමි සිසුන් 250 ක් සඳහා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඇතුළුව මායිම් තාප්පයක් හා පිවිසුම් දොරටුව ඉදි කිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	360.00	-	360.00
විද්‍යා පීඨයේ සත්ව විද්‍යා අධ්‍යනාංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	199.00	-	199.00
පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	171.00	-	171.00
වානිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	230.00	-	230.00

කලා හා සංස්කෘත පීඨය සඳහා ශ්‍රවණාගාරයක් හා දේශන ශාලාවක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	44.60	-	44.60
මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	299.00	-	299.00
උසස් අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරන ලද සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ වන්දාරමුලෙයි පරිශ්‍රය තුල පිරිමි සිසුන් 200 ක් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	182.00	-	182.00
උසස් අධ්‍යාපන අමාත්‍යංශය යටතේ වන්දාරමුලෙයි පරිශ්‍රය තුල පිරිමි සිසුන් 200 ක් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	220.00	-	220.00
උසස් අධ්‍යාපන අමාත්‍යංශය යටතේ මඩකලපුවේ පිලෙලියාර්අඩි හි පිහිටි සෞඛ්‍යය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ ගැහැණු සිසුන් 200 ක් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	220.00	-	220.00
එකතුව	**-**	**-**	**2,046.60**	**-**	**2,046.60**

 # (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව / ලෝක බැංකුව/-------)

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

නම සහ විස්තරය	ණය / ආධාර	අරමුදල් සම්පාදිත ආයතන	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු. මිලියන)	ආපසු ගෙවනු ලබන විදේශාධාර (රු. මිලියන)	දේශීය අරමුදල් (රු. මිලියන)
ත්‍රිකුණාමල මණ්ඩපයේ පිරිමි සිසුන් 100 ක් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	100.00	-	100.00
ත්‍රිකුණාමල මණ්ඩපයේ ගැහැණු සිසුන් 100 ක් සඳහා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	100.00	-	100.00
ත්‍රිකුණාමල මණ්ඩපයේ ශිෂ්‍ය විවේකාගාර මධ්‍යස්ථානයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	45.50	-	45.50
ත්‍රිකුණාමල මණ්ඩපයේ විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	14.00	-	14.00
ක්‍රීඩාංගනයක් ඉදි කිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	50.00	-	50.00
ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	410.00	-	410.00
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	304.40	-	304.40

පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	326.20	-	326.20
ආපන ශාලාව සඳහා විවේකාගාර පහසුකම් වලින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම	ආධාර	ශ්‍රී ලංකා රජය	130.40	-	130.40
එකතුව	**-**	**-**	**1,480.50**	**-**	**1,480.50**

 # (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව / ලෝක බැංකුව/-------)

16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

නම	වෙන්කිරීම් (රු. මිලියන)	වියදම් 2013 (රු. මිලියන)	වියදම් 2014 (රු. මිලියන)	සමුච්චිත වියදම් 2014.12.31 දිනට (රු. මිලියන)	භෞතික ප්‍රගතිය (%)
ස්ථිර ගොඩනැගිලි					
කලා හා සංස්කෘත පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	121.00	55.00	20.00	100.00	99%
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා පිරිමි සිසුන් 250 ක් සඳහා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඇතුළුව මායිම් තාප්පයක් හා පිවිසුම් දොරටුව ඉදි කිරීම	360.00	2.80	57.79	60.70	24%
විද්‍යා පීඨයේ සත්ව විද්‍යා අධ්‍යනාංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	199.00	10.05	35.00	172.14	99%
පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	171.00	65.00	31.00	140.12	99%
වානිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.	230.00	65.00	67.00	185.00	99%
කලා හා සංස්කෘත පීඨය සඳහා ශ්‍රවණාගාරයක් හා දේශන ශාලාවක් ඉදිකිරීම	44.60	-	16.34	16.34	82%
මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	299.00	-	50.72	50.72	33%
උසස් අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරන ලද සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ වන්දාරමුලෙයි පරිශ්‍රය තුල පිරිමි සිසුන් 200 ක් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	182.00	-	73.00	73.00	-
එකතුව	**1,606.60**	**197.85**	**350.85**	**798.02**	**-**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

නම	වෙන්කිරීම් (රු. මිලියන)	වියදම් 2013 (රු. මිලියන)	වියදම් 2014 (රු. මිලියන)	සමුච්චිත වියදම් 2014.12.31 දිනට (රු. මිලියන)	භෞතික ප්‍රගතිය (%)
ත්‍රිකුණාමල මණ්ඩපයේ පිරිමි සිසුන් 100 ක් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම	100.0	15.43	55.16	72.19	97%
ත්‍රිකුණාමල මණ්ඩපයේ ගැහැනු සිසුන් 100 ක් සඳහා නේවාසිකාගාර ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	100.0	17.33	52.39	71.33	97%
ත්‍රිකුණාමල මණ්ඩපයේ ශිෂ්‍ය විවේකාගාර මධ්‍යස්ථානයක් ඉදිකිරීම	45.5	6.88	17.59	24.47	66%
ත්‍රිකුණාමල මණ්ඩපයේ විද්‍යාගාර ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම	14.0	5.77	5.91	11.68	100%
ක්‍රීඩාංගනයක් ඉදි කිරීම	50.0	නැත	23.52	23.52	60%
ව්‍යවහාරික විද්‍යාපීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	410.0	නැත	74.35	74.36	3%
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම	304.4	නැත	28.42	28.42	8%
පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම	326.2	නැත	30.08	30.08	5%
ආපන ශාලාව සඳහා විවේකාගාර පහසුකම් වලින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම	130.4	නැත	23.23	23.24	3%
එකතුව	**1,480.5**	**45.41**	**310.65**	**359.29**	**-**

17. මූල්‍ය ප්‍රගතිය පළිබඳ විස්තර (වියදම්)

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

විෂයය	වෙන්කිරීම් 2014 (රු.)	වියදම් 2014 (රු.)	ඉතුරුම් / වැඩිපුර වියදම් වීම්(රු.)
(අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන	544,390,000.00	642,193,812.28	(97,803,812.28)
(ආ) මූල්‍යන හැර ව්‍යාපෘති	465,000,000.00	504,332,653.76	(39,332,653.76)
(ඇ) ව්‍යාපෘති - දේශීය අරමුදල් සම්පාදිත	-	-	-
(ඈ) ව්‍යාපෘති - විදේශීය අරමුදල් සම්පාදිත	-	-	-
එකතුව	**1,009,390,000.00**	**1,146,526,466.04**	**(137,136,466.04)**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	වෙන්කිරීම් 2014 (රු.)	වියදම් 2014 (රු.)	ඉතුරුම් / වැඩිපුර වියදම් වීම්(රු.)
(අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන	121,364,000.00	131,415,474.76	(10,051,474.76)
(ආ) මූලධන හැර ව්‍යාපෘති	400,000,000.00	215,226,290.92	184,773,709.08
(ඇ) ව්‍යාපෘති - දේශීය අරමුදල් සම්පාදිත	-	-	-
(ඈ) ව්‍යාපෘති - විදේශීය අරමුදල් සම්පාදිත	-	-	-
එකතුව	**521,364,000.00**	**346,641,765.68**	**174,722,234.32**

18. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම)

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

ආදායම් මූලාශ්‍රය	වෙන්කිරීම් 2014 (රු.)	රැස්කිරීම් 2014 (රු.)	ඌනතාවය / අතිරික්තය (රු.)
උපාධි අපේක්ෂක අධ්‍යයන පශ්චාත් උපාධි අධ්‍යයන	7,750,000.00	7,660,712.60	(89,287.40)
උපදේශන සේවා	-	-	-
වෙනත්	8,000,000.00	12,137,759.75	4,137,759.75
එකතුව	**15,750,000.00**	**19,798,472.35**	**4,048,472.35**

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

ආදායම් මූලාශ්‍රය	වෙන්කිරීම් 2014 (රු.)	රැස්කිරීම් 2014 (රු.)	ඌනතාවය / අතිරික්තය (රු.)
උපාධි අපේක්ෂක අධ්‍යයන	1,850,000.00	3,082,494.03	1,182,494.03
පශ්චාත් උපාධි අධ්‍යයන	-	-	-
උපදේශන සේවා	-	-	-
වෙනත්	510,000.00	(72,235.96)	(582,235.96)
එකතුව	**2,360,000.00**	**3,010,258.07**	**600,258.07**

19. මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2014:

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

විෂයය	සූත්‍රය	ඒක ශිෂ්‍ය පිරිවැය (රු.)
ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම	පුනරාවර්තන වියදම / ශිෂ්‍ය සංඛ්‍යාව	153,929.49
ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම	ප්‍රාග්ධන වියදම / ශිෂ්‍ය සංඛ්‍යාව	120,885.10
එකතුව		**274,814.59**

"

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	සූත්‍රය	ඒක ශිෂ්‍ය පිරිවැය (රු.)
ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම	පුනරාවර්තන වියදම / ශිෂ්‍ය සංඛ්‍යාව	200,023.55
ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම	ප්‍රාග්ධන වියදම / ශිෂ්‍ය සංඛ්‍යාව	92,310.49
එකතුව		**292,334.04**

20. 2014 වර්ෂය තුල ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර;

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම (රුපියල් මිලියන)	භෞතික ප්‍රගතිය
කලා හා සංස්කෘත පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම.	121	100%
පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.	171	100%
වානිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.	230	100%
මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.	299	33% නිම කර ඇත.
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.	360	24% නිම කර ඇත.
කලා හා සංස්කෘත පීඨය සඳහා ශ්‍රවණාගාරයක් හා දේශන ශාලාවක් ඉදිකිරීම.	44.6	82% නිම කර ඇත.

(ආ) ත්‍රිකුණාමල මණ්ඩපය

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම (රුපියල් මිලියන)	භෞතික ප්‍රගතිය
මීටර් 10 පළල හා මීටර් 200 ක් තාර සහිත මාර්ගයක් ඉදි කිරීම.	9,964,146.99	73%
ගබඩා ගොඩනැගිල්ලක් ඉදි කිරීම.	3,604,198.72	85%
ඇසුරුම් ගල් යොදා අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය වැඩිදියුණු කිරීම.	12,316,710.68	80%
විශ්වවිද්‍යාල පරිශ්‍රය වටා වානේ කම්බි යොදා මායිම් තාප්පය දීර්ග කිරීම.	2,369,166.10	100%
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, ත්‍රිකුණාමල මණ්ඩපයේ ප්‍රාකාර බිත්තිය වැඩිදියුණු කිරීම.	1,432,339.52	85%
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, ත්‍රිකුණාමල මණ්ඩපයේ මායිම් තාප්පයේ ගරාදි වැට වානේ කම්බි යොදා ගෘහ නිර්මාණය සැලැස්මකට අනුව වැඩිදියුණු කිරීම.	733,507.94	70%
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, ත්‍රිකුණාමල මණ්ඩපයේ පදික මංතීරුව වැඩිදියුණු කිරීම.	649,932.60	25%
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, ත්‍රිකුණාමල මණ්ඩපයේ පිවිසුම් වටපිටාව වැඩිදියුණු කිරීම.	964,260.00	15%
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, ත්‍රිකුණාමල මණ්ඩපයේ පිවිසුම් දොරටුව වැඩිදියුණු කිරීම.	956,177.50	වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් ලබාගෙන තිබුණද මේ දක්වා වැඩ ආරම්භ කර නොමැත.

21. වෙනත් විස්තර / මෙම වාර්තාවට අදාල ක්‍රියාකාරිත්වය :

(අ) 2014 වර්ෂය තුල පැවත්වන ලද විගණන කමිටු රැස්වීම්.

අනු අංකය	රැස්වීම් වාරය	දිනය
1	29 වන විගණන කමිටුව	27.01.2014
2	30 වන විගණන කමිටුව	24.02.2014
3	31 වන විගණන කමිටුව	24.03.2014
4	32 වන විගණන කමිටුව	28.04.2014
5	33 වන විගණන කමිටුව	26.05.2014
6	34 වන විගණන කමිටුව	24.06.2014
7	35 වන විගණන කමිටුව	22.07.2014
8	36 වන විගණන කමිටුව	28.08.2014
9	37 වන විගණන කමිටුව	29.09.2014
10	38 වන විගණන කමිටුව	18.11.2014
11	39 වන විගණන කමිටුව	12.12.2014

22. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවග

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ආර්එන්/බීටී/බී/ඊයූඑස්එල්/1/14/01	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2015 ඔක්තෝබර් 06 දින

නිසි බලධාරී,

ශ්‍රී ලංකා නැගෙන්හිර විශ්ව විද්‍යාලය.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේදී බුත්තල, සේවක සංවර්ධන මධ්‍යස්ථානයෙන් භාර ගන්නා ලද ගොඩනැගිලි හා ලී බඩු ආදී වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) මුළු වටිනාකම රු.19,411,037 ක් වූ ලී බඩු, උපකරණ, පොත් හා වාහන වැනි වත්කම් මඩකලපුව දිස්ත්‍රික්කයේ පැවති යුධ වාතාවරණය හේතුවෙන් 1990 වර්ෂයේදී නැතිවී තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ඇ) උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාළත්වය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමේ (IRQUE) ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව, පරිගණක, ලී බඩු, පොත් හා උපකරණ වැනි එම ව්‍යාපෘතියේ වත්කම් විශ්වවිද්‍යාලයට භාරදී තිබුණි. කෙසේ වුවද එම වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

2.2.2 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා විශ්වවිද්‍යාලයෙන් මාරුවී ගිය නිලධාරීන් 307 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.9,716,548 ක් වූ ණය ශේෂයන් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට හෝ අදාළ නිලධාරින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට 2015 ජූනි 30 දක්වාත් විශ්වවිද්‍යාලය විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) විදේශ සැපයුම්කරුවන්ට ලබාදුන් එකතුව රු.5,000,378 ක් වූ අත්තිකාරම් එම ශේෂ අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම පිළිබඳ විමර්ශනය කිරීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් ආනයන අත්තිකාරම් ගිණුම් 135 ක පැවතුණි.

(ඇ) විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු.14,604,399 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 5 සිට 18 දක්වා කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

නීති, රීති හාරෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වු ආයතන සංග්‍රහය	
(i) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය	අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පොදු ආකෘති 96 මඟින් මාසිකව විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි.

(ii) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට විශ්ව විද්‍යාලය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. වෙනත් සියළු විශ්ව විද්‍යාල පරිදි සම්ප්‍රදායක් වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පැමිණීමේ ලේඛනයක පැමිණීම සටහන් නොකරන බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 102 සිට 105	(i) විශ්වවිද්‍යාලය සතු වාහනයක් අනතුරකට භාජනය වී තිබූ අතර එම වාහනය අළුත් වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,563,073 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද පාඩුවේ ප්‍රමාණය හා හේතුව නිශ්චය කර ගැනීම සඳහා හා වගකීම් පැවරීම සඳහා පියවර ගෙන නොතිබුණි.
	(ii) සමාලෝචිත වර්ෂය අවසානයට සිදුකරන ලද භෞතික පරීක්ෂණයට අනුව, උප කුලපති නිල නිවසේ ඉන්වෙන්ට්‍රි විෂයයන් 913 ක ඌනතාවයක් විය. මේ සම්බන්ධයෙන් පාඩුවේ ප්‍රමාණය නිශ්චය කර ගැනීමට හා වගකීම් පැවරීමට විමර්ශනයක් සිදුකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.777,087,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.863,344,968 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.621,470,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.765,406,686 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.97,938,232 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පුද්ගල පඩිනඩි රු.77,049,832 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

(අ) විභාග ප්‍රතිඵල

2014 වර්ෂයේදී පවත්වන ලද අවසන් විභාග හා සමත්වූ උපාධිධාරීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

විස්තරය	කෘෂිකර්ම පීඨය	කලා හා සංස්කෘතික පීඨය	වාණිජ හා කළමනාකරණ පීඨය	විද්‍යා පීඨය	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය
සමාලෝචිත වර්ෂය තුළදී අවසාන විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	38	289	165	19	36
විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව	38	289	95	12	36
(උපාධි විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව) අවසාන විභාග සඳහා පෙනීසිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	100%	100%	58%	63%	100%

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාණිජ හා කළමනාකරණ පීඨයේ ව්‍යාපාර පරිපාලන උපාධිය, සඳහා ප්‍රතිඵල සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර නොතිබූ අතර එය 2015 ජනවාරි මාසයේදී නිකුත් කර තිබුණි. ඒ අනුව වාණිජ උපාධිය හා ව්‍යාපාර පරිපාලන උපාධිය යන උපාධි ධාරාවන් දෙකම සඳහා සමත් වූ මුළු සිසුන් සංඛ්‍යාව 142 ක් වූ අතර පීඨ සමත් අනුපාතය සියයට 89 ක් විය.

(ii) විශ්ව විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඉදිකිරීම් / පළමු මූලධර්මවල න්‍යායාත්මක සංකල්ප සැකස්ම හා ඊළඟට නියම ලෝක තත්ත්ව ආදර්ශ අවබෝධ කර ගැනීම සඳහා සංවර්ධනය ඇතුළත් මූලික විද්‍යාව (ශුද්ධ විද්‍යාව) පිළිබඳ ගැඹුරු අධ්‍යයනය සිදුකළ යුතුවීම හේතුවෙන් විද්‍යා පීඨයේ පළමු ප්‍රයත්නයේදී සමත්වන අනුපාතය සැලකිය යුතු ලෙස අඩුවී තිබුණි.

(ආ) ශිෂ්‍යයින් බඳවා ගැනීම

පසුගිය වර්ෂ 03 තුළදී එක් එක් පීඨය සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව හා උපාධි ලබාගැනීමෙන් පසුව පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

පීඨය	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			උපාධිය ලබාගැනීමෙන් පසු පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව		
	2014	2013	2012	2014	2013	2012
කෘෂිකර්ම	118	83	65	22	27	18
කලා හා සංස්කෘතික	210	276	543	311	374	305
වාණිජ හා කළමනාකරණ	208	201	180	81	96	54
විද්‍යා	192	214	151	34	57	27
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා	89	80	101	42	27	-
එකතුව	817	854	1,040	490	581	404

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ කෘෂිකර්ම පීඨයට බඳවාගත් සිසුන් සංඛ්‍යාව සියයට 42 කින් වැඩිවී තිබූ අතර කලා හා සංස්කෘතික පීඨය සහ විද්‍යා පීඨයට සමාලෝචිත වර්ෂය තුළ බඳවා ගත් සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 24 කින් හා සියයට 10 කින් අඩුවී තිබුණි.

(ඇ) පුස්තකාල පරිපාලනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කථිකාචාර්යවරුන් 15 දෙනෙකු විසින් පුස්තකාලයෙන් ලබාගත් පොත් 52 ක් නියමිත කාලපරිච්ඡේදය තුළ පුස්තකාලයට ආපසු භාරදීමෙන් තොරව වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක් රඳවා ගෙන තිබුණි. කෙසේ වුවද මෙම පොත් ආපසු ලබාගැනීමට හෝ ප්‍රමාදයන් සඳහා රු.430,684 ක දඩ මුදලක් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.

(ii) ගං වතුර, දිලීර හා කෘමීන් නිසා හානිවූ රු.675,020 ක් පිරිවැය වූ පොත් ගිණුම් පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් කාර්යක්ෂමතා

4.2.1 ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ලී තට්ටු ඇඳන් හා අධ්‍යයන මේස ප්‍රසම්පාදනය

තට්ටු ඇඳන් 600 ක් සහ ලී අධ්‍යයන මේස 400 ක් සැපයීම සඳහා 2014 අගෝස්තු 15 දින අක්කරෙයිපත්තුහි පුද්ගලික සැපයුම්කරුවකුට රු.44,559,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු කරුණු හා කොන්දේසිවල 26 වගන්තිය අනුව රු.4,445,000 ක් වටිනා කාර්ය සාධන ඇපකරයක් 2014 අගෝස්තු 25 ට පෙර ඉදිරිපත් කළ යුතු විය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීම් කළ පරිදි කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කර නොතිබුණි.

(ii) විශ්ව විද්‍යාලයෙන් ගැණුම් ඇණවුමක් ලබාගැනීමෙන් තොරව සැපයුම්කරු විසින් 2014 ඔක්තෝබර් 10 සිට නොවැම්බර් 03 දක්වා කාල පරිච්ඡේදය තුළ රු.11,632,500 ක මුළු වටිනාකමට තට්ටු ඇඳන් 200 ක් හා අධ්‍යයන මේස 25 ක් සපයා තිබුණි. කෙසේ වුවද සියළු භාණ්ඩ ලැබීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් අදාළ සැපයුම්කරුට ගැණුම් ඇණවුම් නිකුත් කර තිබුණි.

4.2.2 ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා කල් බදු පදනම මත ගොඩනැඟිලි ප්‍රසම්පාදනය

(අ) ශිෂ්‍යාවන් 250 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයීමේ අරමුණින් මඩකලපුව, තන්නමුනෙයි හි ශාන්ත ජෝශප් කාන්තා නිවාසයේ ගොඩනැඟිල්ලක් කල් බදු පදනම මත විශ්වවිද්‍යාලය විසින් ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) තක්සේරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් තක්සේරුකරු විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවට අනුව, මෙම ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු.170,000 ක් විය. කෙසේ වුවද දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වටිනාකම සැලකීමෙන් තොරව රු.400,000 ක මුදලක් මාසික කුලිය ලෙස විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිල්ල අයිතිකරුට සමාලෝචිත වර්ෂය තුළ රු.1,150,000 ක මුදලක් කුලී ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා යොදා ගැනීමට සුදුසු හා පිරිවැය ඵලදායී ගොඩනැගිල්ලක් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් රජයේ ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ආ) ශිෂ්‍යාවන් 65 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයීමට මඩකලපුව, පුලියඩිකුඩා හි පිහිටි වෙනත් ගොඩනැගිල්ලක රු.130,000 ක මාසික කුලියකට 2014 මැයි 01 දින සිට ලබාගෙන තිබුණි. කෙසේ වුවද තක්සේරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවට අනුව, මෙම ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු.82,500 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිල්ලේ අයිතිකරුට රු.570,000 ක මුදලක් කුලී ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

4.2.3 උප කුලපති නිල නිවස සඳහා විදුලි උත්පාදන යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීම

උපකුලපතිගේ නිල නිවසේ භාවිතය සඳහා රු.1,675,610 කට පුද්ගලික සමාගමකින් විදුලි උත්පාදන යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් මිලදී ගෙන තිබුණි. වගකීම් කාලය තුළ නොමිලයේ සේවා සැපයීම සඳහා සැපයුම්කරු එකඟවී තිබුණි. කෙසේ වුවද විශ්ව විද්‍යාලය විසින් මෙම සේවය ලබාගෙන නොතිබූ අතර, විදුලි උත්පාදන යන්ත්‍රයේ අව්ධිමත් නඩත්තුව හේතුවෙන් වගකීම් කාල පරිච්ඡේදය තුළ මාස 2 කට වැඩි කාලයක් එම යන්ත්‍රය ක්‍රියාවිරහිතව තිබුණි.

4.2.4 විශ්ව විද්‍යාල පරිශ්‍රයේ බිම් දසුන් සැකසීම හා ගස් සිටුවීම

එවකට ජනාධිපතිවරයාගේ පැමිණීම හා විද්‍යා පීඨයේ ගොඩනැඟිලි සංකීර්ණය විවෘත කිරීම සනිටුහන් කිරීම සඳහා විද්‍යා පීඨ ගොඩනැඟිලි සංකීර්ණයේ ප්‍රධාන ප්‍රවේශය ඉදිරිපස බිම් දසුන් සැකසීම හා ගස් සිටුවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,752,740 ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම කාර්යය සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විවෘත තරඟකාරී ලංසු පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව, 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතියේ (HETC) උපදේශක විසින් නිර්දේශ කරන ලද කොන්ත්‍රාත්කරු විශ්වවිද්‍යාලය විසින් තෝරා ගෙන තිබුණි.

(ආ) 2014 අප්‍රේල් 18 දින අදාළ කාර්යයන් කොන්ත්‍රාත්කරු විසින් ආරම්භ කර තිබුණද, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) විසින් එම කොන්ත්‍රාත්කරු 2014 ජූලි 01 දින වැඩ නිම කිරීමෙන් පසුව තෝරා ගෙන තිබුණි.

(ඇ) සමාන වර්ගයේ පැල සඳහා වෙළඳපොළ පවත්නා හෝ වෙනත් සමාන සැපයුම්කරුවන්ගෙන් ලබාගත් රේටයන් සැලකීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රේටයන් පදනම් කරගෙන කොන්ත්‍රාත්කරුට රු.1,752,790 ක ගෙවීමක් කර තිබුණි.

4.2.5 උපකුලපති නිල නිවස සඳහා ගෘහ භාණ්ඩ විෂයයන් මිලදී ගැනීම

කෑම මේස , නිදන කාමර කට්ටල, යෝග්‍යතා උපකරණ, සෝපා කට්ටල, ඇඳන් හා පුටු ආදී ගෘහ භාණ්ඩ විෂයයන් රු.1,447,873 ක වටිනාකමට 2013 මාර්තු 12 දින කොන්ත්‍රාත්කරුවකුගෙන් මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීම වෙනුවට ඉහත සඳහන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා මොරටුව සැපයුම්කරුවකුගෙන් ලබාගත් වෙනස් කිරීම් කිහිපයක් සහිත කඩදාසියක වූ ව්‍යාජ මිල සැඳහුමක් 2013 මාර්තු 12 දින උපකුලපතිවරයා විසින් අනුමත කර තිබුණි. තවද සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිලට අමතරව සියයට 10 ක ආන්තිකයක්ද ගෙවීම හේතුවෙන් විශ්ව විද්‍යාලයට රු.131,625 ක පාඩුවක් සිදුවී තිබුණි.

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) 2014 ජුනි 24 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම අනුව, පරිගණක 155 ක් හා යූපී-එස් 06 ක් ප්‍රසම්පාදනය කිරීමේදී දරන ලද රු.4,233,370 ක පාඩුව විශ්ව විද්‍යාලයේ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද ඉහත පාඩුව 2015 ජුනි 30 දක්වාත් අයකර ගෙන නොතිබුණි. එම කාරණය පිළිබඳ සිදුකරන ලද විනය පරීක්ෂණය සඳහා විමර්ශන නිලධාරියා විසින් කරන ලද නිර්දේශයන් හා ඉදිරිපත් කරන ලද වාර්තාව සඳහා අධ්‍යයනයන් හා සමාලෝචනය කිරීමට සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කිරීමට තීරණය කළ බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) 2012 ජුනි 23 අත්සන් කරන ලද ගිවිසුම අනුව, විශ්වවිද්‍යාලය, ත්‍රිකුණාමලය පීඨය හා සෞන්දර්ය අධ්‍යයනය සඳහා ස්වාමි විපුලානන්ද ආයතනය (SIVAS) සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා උපදේශක කාර්යයන් 2012 අප්‍රේල් 16 දින සිට මාස 03 ක් ඇතුළත නිම කළ යුතු විය. කෙසේ වුවද එම කාර්යය 2015 ජුනි 30 වන විටත් නිමකර නොතිබුණි.

(ඇ) ශිෂ්‍යත්ව මත විදේශගත වූ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 74 දෙනෙකු ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසුව රාජකාරි සඳහා වාර්තා කර හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත් වී නොතිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් කථිකාචාර්යවරුන් 74 දෙනෙකුගෙන් එකතුව රු.160,937,945 ක මුදලක් අයකර ගැනීමට 2015 ජුනි 30 වන විටත් විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. ගිවිසුම් කඩ කළ 74 දෙනෙකුගෙන් සිද්ධීන් 12 සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා ලැබිය යුතු මුදල් ඔවුන්ගෙන් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට භාරදී ඇති බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා තිබුණි.

(ඈ) ශිෂ්‍යත්ව සඳහා විදේශගත වන කථිකාචාර්යවරුන්ගෙන් නිවාඩු අනුමත කිරීමට පෙර අත්තිකාරම් අයකර ගත යුතුය. කෙසේ වුවද බැඳුම්කර ගිවිසුම් කඩකළ කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගෙන් එකතුව රු.204,551 ක හිඟ අත්තිකාරම් ශේෂයන් අයකර ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යත්ව සඳහා නිවාඩු ලබාදී තිබුණි.

(ඉ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 72(1) වගන්තිය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21.1.1 වගන්තිය අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා කථිකාචාර්ය තනතුරක (පරිවාස) කථිකාචාර්යවරයකු විසින් වර්ෂ 08 ක් ඇතුළත පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ යුතුය. කෙසේ වුවද නිශ්චිත කාල පරිච්ඡේදය තුළ පශ්චාත් උපාධිය සම්පූර්ණ නොකළ කථිකාචාර්යවරුන් 17 දෙනෙකු තාවකාලික කථිකාචාර්යවරුන් ලෙස ඔවුන් ආපසු එම තනතුරු වලට යැවීමෙන් තොරව ජ්‍යෙෂ්ඨ කාථිකාචාර්ය II ශ්‍රේණිය ලෙස උසස්වීම් ලබාදී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ රු.13,399,453 ක් වැය කරමින් විශ්වවිද්‍යාලයේ අමුත්තන්ගේ නිවාසයේ පැරණි ගොඩනැගිල්ලක් අළුත් වැඩියා කර තිබූ අතර මෙම ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද විදුලි පංකා , විදුලි පහන් , විදුලි උත්පාදන යන්ත්‍ර හා ස්විච්ස් ආදී වටිනා භාණ්ඩ 2012 අගෝස්තු 30 දින විශ්වවිද්‍යාලයේ විදුලි කාර්මිකට භාරදී තිබුණි. කෙසේ වුවද, උප කුලපති නිල නිවසේ පවත්වා ගෙන යන ඉන්වෙන්ට්‍රි ලේඛනයේ මෙම විෂයයන් ඇතුළත් කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(උ) එවකට සිටි උපකුලපතිවරයා 2015 මාර්තු 05 සිට බලපැවැත්වෙන පරිදි විශ්ව විද්‍යාලයෙන් ඉවත්වී තිබුණි. ඔහුගෙන් අයවිය යුතු රු.45,182 ක ණය ශේෂ අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

4.4 මානව සම්පත් කළමනාකරණය

විශ්වවිද්‍යාලයේ පීඨ පහක් සඳහා මහාචාර්යවරු ඇතුළත් ප්‍රධාන අධ්‍යයන තනතුරු 23 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 64 කින් ජ්‍යෙෂ්ඨ කථිකචාර්ය හා කථිකාචර්ය තනතුරු 41 ක පුරප්පාඩු පැවතුණි. කෙසේ වුවද 2015 ජුනි 30 දක්වාත් මෙම තනතුරු පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.

4.5 වත්කම් කළමනාකරණය

" පටක සකස් කිරීම පිළිබඳ උපාංග අටක් " (eight accessories of the tissue processor) නම් වූ වෛද්‍ය උපකරණය රු.මිලියන 4.5 ක පිරිවැයකට 2012 වර්ෂය තුළ ප්‍රසම්පාදනය කර තිබුණද, පටක සකස් කිරීම් උපකරණයේ ප්‍රධාන කොටස මිලදී ගැනීමට නොහැකිවීම හේතුවෙන් එය මිලදී ගත් දින සිටම සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ නිෂ්කාර්යව පැවතුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට ස්ථිර හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් පත් කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා 4.2.3 වගන්ති ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 3 ක කාල පරිච්ඡේදයක් ඇතුළත සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.4 අයවැය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ණය සහ අත්තිකාරම් අයකර ගැනීම

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

23\. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාලව කළමනාකරණයේ හේතු පැහැදිලි කිරීම

විගණන ජේද යොමුව		නිරීක්ෂණයන්
2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම		
2.2.1 ගිණුම්කරණ අඩුපාඩු :		
පහත සඳහන් ගිණුම්කරණ අඩපාඩු නිරීක්ෂණය විය		
(අ)	2011 වර්ෂයේදී බුත්තල, සේවක සංවර්ධන මධ්‍යස්ථානයෙන් භාර ගන්නා ලද ගොඩනැගිලි හා ලී බඩු ආදී වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.	එකගවෙමි අදාල වත්කම් මේවන විටත් ප්‍රත්‍යාගනනය කර ගිණුම් වාර්තාවල ප්‍රාග්ධනිත කර ඇත. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ (ශ්‍රී.ලං.නැ.වි.වි) ස්ථාවර වත්කම් ලේඛනය සකස් කොට ඇති අතර මෙම වටිනාකම 2015-12-31 දිනට ජංගම නොවන වත්කම් යටතේ අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ)	මුළු වටිනාකම රු. 19,411,037 ක් වූ ලී බඩු, උපකරණ, පොත් හා වාහන වැනි වත්කම් මඩකලපු දිස්ත්‍රික්කයේ පැවති යුධ වාතාවරණය හේතුවෙන් 1990 වර්ෂයේදී නැතිවී තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.	එකගනොවෙමි නැතිවීම් වල මුළු වටිනාකම රුපියල් 19,411,037.00 ක් වේ. භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මේ දක්වා ලැබීනොමැති බැවින් ගිණුම් ප්‍රකාශනවල කිසිදු ගැලපීමක් සිදුකොට නොමැත. මුදල් රෙගුලාසි 102 ප්‍රකාරව රුපියල් 19,411,037.00 ක වටිනාකමින් යුත් හානි වීම් පොත් වලින් කපාහැරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස කරන ඉල්ලීමක් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත මේවන විටත් යොමු කර ඇත. අදාල අනුමැතිය ලද විගස අවශ්‍ය ගැලපීම් ගිණුම් ප්‍රකාශනවල සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීමේ (IRQUE) ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව, පරිගණක, ලී බඩු, පොත් හා උපකරණ වැනි එම ව්‍යාපෘතියේ වත්කම විශ්වවිද්‍යාලයට භාරදී තිබුණි. කෙසේ වුවද එම වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.	උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීමේ (IRQUE) ව්‍යාපෘතිය යටතේ මිලදී ගනු ලැබූ සියළුම වත්කම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2009-10-15 දිනැති ලිපිය ප්‍රකාරව අදාල දෙපාර්තමේන්තු වෙත මාරුකිරීම සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ දේශීය කාර්යාලය මගින් කටයුතු කර තිබුනි. එසේම අදාල වත්කම් මේවන විටත් ප්‍රත්‍යාගනනය කර මූල්‍ය ප්‍රකාශන වල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත.

			අදාල වට්නාකම 2015-12-31 දිනට ජංගම නොවන වත්කම් ප්‍රකාශනයෙහි අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.
2.2.2 ලැබිය යුතු ගිණුම්			
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.			
(අ)	විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා විශ්වවිද්‍යාලයෙන් මාරුවී ගිය නිලධාරීන් 307 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 9,716,548ක් වු ණය ශේෂයන් වර්ෂ 5 කට වැඩි කාලයක් හිග හිට පැවතුණි. එම හිග ණය ශේෂ අයකර ගැනීමට හෝ අදාළ නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට 2015 ජූනි 30 දක්වාත් විශ්වවිද්‍යාලය විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		එකගවෙමි අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීම සඳහා පහත පරිදි කටයුතු කරනු ලැබේ. විශ්‍රාම ගිය නිළධාරීන් (නීතිමය ක්‍රියාමාර්ග මගින්/ඔවුන්ගේ විශ්වවිද්‍යාල අරමුදල මගින් සේවය හැරගිය නිළධාරීන්) ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ විශ්වවිද්‍යාල අරමුදලින් ස්ථාන මාරුවීම් ලද නිළධාරීන්ගෙන්)එකිනෙක පුද්ගලයාට වෙන වෙනම ඉල්ලීම් ලිපි යැවීම/ඔවුන් ස්ථාන මාරුවීම් ලැබ ගිය අදාල ආයතනවලට ලිපි යැවීම.
(ආ)	විදේශ සැපයුම්කරුරුවන්ට ලබාදුන් එකතුව රු.5,000,378 ක් වු අත්තිකාරම් එම ශේෂ අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම පිළිබඳ විමර්ශනය කිරීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් ආනයන අත්තිකාරම් ගිණුම් 135 ක පැවතුනි.		එකගවෙමි බොහෝමයක් සැපයුම් අත්තිකාරම් 1996 වර්ෂයේදී ගෙවා ඇත. මෙම වර්ෂයේ පැවති වාතාවරණය අනුව ඇනවුම් කරන ලද භාණ්ඩ කොළඹ අවට සැපයුම්කරුවන්ගෙන් අදාල මෙහොතේ ගෙවීම් කර ලබා ගැනීමට සිදුවේ. එමනිසා සෘජුවම ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා චෙක්පත් කලින් ලිවීමට කටයුතු කර ඇති අතර අදාල භාණ්ඩ ලද විගස මෙම අත්තිකාරම් පියවීමට කටයුතු කර නොමැත. මෙය අපගේ දුර්වලතාවයකි. මෙය නිවැරදිකෙරෙනු ඇති.
(ඇ)	විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු. 14,604,399 ක් වු අත්තිකාරම් අයකර ගැනීම කටයුතු කිරීමෙන් තොරව පැවතුනි.		
2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම			
විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම අවස්ථා පහත දැක්වේ.			
නීති, රීති රෙගුලාසි වලට යොමුව			**අනුකූල නොවීම**
(අ)	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය		
(i)	X පරිච්ජේදයේ 20.6 වගන්තිය	අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පොදු ආකෘති 96 මගින් මාසිකව විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි.	එකගවෙමි අදාල රෙගුලාසි පරිදි සියළුම වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු කෙරෙනු ලැබේ.

(ii)	XXVIIපරිච්ඡේදයේ 3.1 වගන්තිය	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛණයක් පවත්වා ගැනීමට විශ්ව විද්‍යාලය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. වෙනත් සියළු විශ්ව විද්‍යාල පරිදි සම්ප්‍රධායක් වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පැමිණීමේ ලේඛණයක පැමිණීම සටහන් නොකරන බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරී විසින් මා වෙත දන්වා සිටීම.	එකඟවෙමි සම්ප්‍රධායක් ලෙස අනෙකුත් සියළුම විශ්වවිද්‍යාල මෙන් අධ්‍යන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කරනු නොලබයි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
(i)	මුදල් රෙගුලාසි 102 සිට 105	විශ්වවිද්‍යාලය සතු වාහනයක් අනතුරකට භාජනය වී තිබූ අතර එම වාහනය අළුත් වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,563,073 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද පාඩුවේ ප්‍රමාණය හා හේතුව නිශ්චය කර ගැනීම සඳහා හා වගකීම් පැවරීම සඳහා පියවර ගෙන නොතිබුණි.	එකඟවෙමි විනය පරීක්ෂණයක් කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කරන ලදි. පසුව පොලිස් ප්‍රකාශය මගින් රියදුරු වැරදිකරු කර නොතිබූ බැවින් මෙය ඉදිරියට පවත්වාගෙන නොයන ලදි.
(ii)	මුදල් රෙගුලාසි 102 සිට 105	සමාලෝචිත වර්ෂය අවසානයට සිදුකරන ලද භෞතික පරීක්ෂණයට අනුව, උප කුලපති නිල නිවසේ ඉන්වෙන්ට්‍රි විෂයයන් 913 ක ඌනතාවයක් විය. මේ සම්බන්ධයෙන් පාඩුවේ ප්‍රමාණය නිශ්චය කර ගැනීමට හා වගකීම් පැවරීමට විමර්ශනයක් සිදුකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.	අඩවශයෙන් එකඟවෙමි උප කුලපතිවරයාගේ නිල නිවසේ සිදු කරන ලද අළුත්වැඩියා කටයුතු හේතුවෙන් බොහෝමයක් අයිතම උපකුලපතිවරයා සඳහා කුලියට ගන්නා ලද වාසස්ථානය වෙත මාරුකර යැවීමට කටයුතු කරන ලද අතර මෙම කාලය තුලදී භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමටද නොහැකි විය. අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව උප කුලපතිවරයාගේ නිල නිවස බොහෝමයක් අයිතම අලුතින් සැපයීමට කටයුතු කරන ලද අතර අනෙකුත් ඉන්වෙන්ට්‍රි අයිතම මඩකලපුවේ සහ කොළඹ පිහිටි සංචාරක නිකේතන වෙත මාරු කිරීමට කටයුතු කරන ලදි. ඌණතාවයක් ඇති 913 ක් වන ඉන්වෙන්ට්‍රි අයිතම අතර මදුරුදැල්, තුවා, ඇඳ ඇතිරිලි, කොට්ට උර, වීදුරු, පිඟන් යනාදී පාරිභෝගික භාණ්ඩ ගනනාවක් ඇතුලත් විය. මෙම අයිතම ප්‍රයෝජනයට ගත නොහැකි අයිතම ලෙස වෙනම ස්ථානයක තබා ඇති අතර සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශය මත බැහැර කිරීමට කටයුතු කරනු ලැබේ. භාණ්ඩ

			ලේඛන යාවත්කාලීන කර නොමැති බව අප විසින් එකඟ වන අතර භාණ්ඩ ලේඛන යාවත්කාලීන කිරීමට සහ මෙහි සඳහන් ඌණතාවයන් නිවැරදි කිරීම සඳහා මේ වන විටත් කටයුතු කරමින් පවතී.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.777,087,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.863,344,968 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.621,470,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.765,406,686 ක ඌණතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.97,938,232 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පුද්ගල පඩිනඩි රු.77,049,832 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.	සටහන් කරගතිමි මෙම ප්‍රතිඵලය සඳහා හේතු වී ඇත්තේ පහත සඳහන් කරුණු හේතුවෙන් අයවැය ප්‍රතිපාදනය ඉක්මවා වියදම් දැරීමට සිදුවීමයි. 1. විශේෂ දීමනා ඉහල යාම සහ 20% අතිරේඛ විශේෂ දීමනාවන් ගෙවීම. 2. නව නේවාසිකාගාර සහ පීඨ ගොඩනැගිලි ඉදිකිරීම හේතුවෙන් විදුලි ගාස්තු ඉහල යාම. 3. ජංගම නොවන වත්කම් ක්ෂය වීම් හා ක්‍රමක්ෂය වීම් වැනි මුදල් ප්‍රවාහයන් නොවන වියදම් ඉහල යාම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ

(අ)	විභාග ප්‍රතිඵල	සටහන් කරගතිමි
(ආ)	ශිෂ්‍යයින් බඳවාගැනීම	
(ඇ)	පුස්තකාල පරිපාලනය: මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.	එකඟවෙමි අධ්‍යන කාර්යමණ්ඩලයේ පහලොස් දෙනා අතරින් දෙදෙනෙකු පොත්පත් භාරදීමට කටයුතු කර ඇත. තවදුරටත් සේවයේ යෙදී සිටින කාර්යය මණ්ඩලය විසින් ලබාගෙන ඇති පොත් පත්වල වටිනාකම හෝ නියම කරන දඩ මුදල් පාලක සභාවේ අනුමැතිය මත අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙනතිබුණි. විශ්ව විද්‍යාලයෙන් සේවය කර හැරගිය කාර්යය මණ්ඩලයෙන් අදාල දඩ මුදල් හා පොත්වල වටිනාකම ඔවුන්ගේ විශ්ව විද්‍යාල අරමුදලින් අයකර ගැනීමට ඔවුන් විසින් විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීම සඳහා අදාල ලියකිවියලි භාරදෙන අවස්ථාවේදී කටයුතු කෙරෙනු ලැබේ.
(i)	කථිකාචාර්යවරුන් 15 දෙනෙකු විසින් පුස්තකාලයෙන් ලබාගත් පොත් 52 ක් නියමිත කාලපරිච්ජේදය තුළ පුස්තකාලයට ආපසු භාරදීමෙන් තොරව වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක් රඳවා ගෙන තිබුණි. කෙසේ වුවද මෙම පොත් ආපසු ලබාගැනීමට හෝ ප්‍රමාදයන් සඳහා රු.430,684 ක දඩ මුදලක් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.	

(ii)	ගංවතුර පුස් සහ කෘමීන් හේතුවෙන් විනාශ වූ රු 675,020.00 ක පිරිවැය වූ පොත් වල වටිනාකම ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. මෙම පොත්වල වටිනාගම ගිනුම් පොත් වලින් ලියා කාරිම සඳකා පහත සඳහන් පියවර දැනටමත් ගෙන ඇත. • ලිය හරින පොත්වල වටිනාකම නිර්දෙසිය කිරිමට පුස්තකාල කමිටුව විසින් අනු කමිටුවක් පත් කර තිබුණි. • මුල්ය කමිටුවෙ නිර්දිශිය සදකා, ලියහරිමට විශ්ව විඩ්යල සබවෙ ඩනුම් තියට සතහ මුල්ය කමිටුව වෙත මෙමොරන්තුවක් ඉතිරිපත් කරන ලති • ගවික්ශන මන්ඩලය විසින් නිවරති ක්‍රිය අනුමතය කර නොතිබු බවින් 2015.06.04 තින පවෙති අන්ක 52 ඩරන මුතල් කමිටුව මෙමොරන්තුව නිර්තෙශ නොකල අතර සහ අඩුපාඩු නිවරෙති අක්‍ර නවත ඔය්හිරිපත් කිරිමට පුස්තකාල පතිනියට ඩනුම් ඩෙන ලතෙ. මුදල් කමිටුවෙ නිර්තෙසහය අනුමතය කිරිමට කිරිමට/පියවර ගතිමින් තිබෙ.
4.2	**මෙහෙයුම් කාර්යක්ෂමතා**	
4.2.1	**ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ලී තට්ටු ඇඳන් හා අධ්‍යයන මේස ප්‍රසම්පාදනය**	
	තට්ටු ඇඳන් 600 ක් සහ ලී අධ්‍යන මේස 400 ක් සැපයීම සඳහා 2014 අගෝස්තු 15 දින අක්කරෛපත්තහි පුද්ගලික සැපයුම්කරුවෙකුට රු.44,559,900 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.	එකගවෙමි විශ්ව විද්‍යාලය අදාල ලී බඩු උපකරණ පහත හේතු නිසා හැකිතාක් ඉක්මනින් මිලදී ගැනීමට අදහස් කරන ලදි. • සමාලෝචිත වර්ෂය තුලදී විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විශ්ව විද්‍යාලය වෙත වෙන්කරන ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයටත් වඩා වැඩියෙන් ඉහල දැමීම හේතුවෙන් ඔවුනට අවශ්‍ය ලීබඩු උපකරණ සපයාදීමට අපහට සිදුවීම. • උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිකරමින් පැවති නව නේවාසිකාගාරය සඳහා අවශ්‍ය ලීබඩු උපකරණ සැපයීමට විශ්ව විද්‍යාලයට සිදුවීම හා මෙම නේවාසිකාගාර සඳහා සම්පූර්ණ ලීබඩු උපකරණද සපයා හැකි ඉක්මනින් විවෘත කරන ලෙස අමාත්‍යාංශය මගින්ද බලකර සිටීම. ඊලග ශිෂ්‍ය කණ්ඩායමද බඳවාගැනීම සඳහා සූදානම්ව පැවති බැවින් ඉහත
(i)	කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු කරුණු හා කොන්දේසිවල 26 වගන්තිය අනුව රු.4,455,000 ක් වටිනා කාර්ය සාධන ඇපකරයක් 2014 අගෝස්තු 25 ට පෙර ඉදිරිපත් කළ යුතු විය.කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීම් කළ පරිදි කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කර නොතිබුණි.	

		සිසුන් සඳහා අධ්‍යන පාඨමාලා වාහාම ආරම්භ කිරීමට තීරණය කරන ලදි. එබැවින් ශ්‍රී.ලං.නැ.වි.වි අදාල සැපයුම්කරුවන්ගෙන් ලී බඩු මිලදීගැනීම සඳහා මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2014.08.25 දිනට පෙර කාර්‍යසාධන බැදුම්කරයක් ලබාදෙන ලෙස අදාල සැපයුම්කරුට දන්වා සිටින ලදි. එනමුත් සැපයුම්කරු අදාල බැදුම්කරය ලබාදීමට අපොහොසත් වූ අතර ඔහු 2014 සැප්තැම්බර් මස පළමු සතියේ සිට ක්‍රියාත්මක වන පරිදි කිසිදු මිලදීගැනීමේ ඇනවුමකින් තොරව භාණ්ඩ සැපයීමට කටයුතු කරන ලදි. ශිෂ්‍ය අර්බුදය වැලැක්වීම සඳහා අදාල භාරගැනීමට ශ්‍රී.ලං.නැ.වි විද්‍යාලයට සිදු වු අතර කාර්‍යසාධන බැදුම්කරය ලබා දීමට කටයුතු කරන ලෙස අදාල සැපයුම්කරුට නැවත වතාවක් උපදෙස් ලබාදෙන් ලදි. කාර්යසාධන බැදුම්කරයේ වටිනාකමට වඩා වැඩි වටිනාකමකින් යුත් භාණ්ඩ ඒ වන විටත් සපයා ඇති බව අදාල සැපයුම්කරුට නැවත වතාවක් උපදෙස් ලබාදෙන ලදි. කාර්‍යසාධන බැදුම්කරයේ වටිනාකමට වඩා වැඩි වටිනාකමකින් යුත් භාණ්ඩ ඒවන විටත් සපයා ඇති බව අදාල සැපයුම්කරු විසින් දන්වා සිටින ලදි. එබැවින් අප කාර්‍යසාධන බැදුම්කරයේ වටිනාකමට වඩා වැඩි වටිනාකමකින් සහිත ගෙවීමක් අත්හිටුවීමට තීරණය කලෙමු. එසේම මෙම මිලදීගැනීම සඳහා මුළු මුදලම ගෙවීමට අප විසින් කටයුතු කර නොමැති අතර විශ්වවිද්‍යාලයට මේ සම්බන්ධයෙන් කිසිදු පාඩුවක් සිදුවී නොමැත.
(ii)	විශ්ව විද්‍යාලයෙන් ගැණුම් ඇනවුමක් ලබාගැනීමෙන් තොරව සැපයුම්කරු විසින් 2014 ඔක්තෝම්බර් 10 සිට නොවැම්බර් 03 දක්වා කාල පරිච්පේදය තුළ රු. 11,632,500 ක මුළු වටිනාකමට තට්ටු ඇඳන් 200 ක් හා අධ්‍යයන මේස 25 ක් සපයා තිබිණි. කෙසේ වුවද සියළු භාණ්ඩ ලැබීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් අදාළ සැපයුම්කරුට ගැණුම් ඇණවුම් නිකුත් කර නොතිබුණි.	අර්ධ වශයෙන් එකගවෙමි සැපයුම්කරු 2014 සැප්තැම්බර් මස පළමු සතියේ සිට ක්‍රියාත්මක වන පරිදි කිසිදු භාණ්ඩ ඇනවුමකින් තොරව භාණ්ඩ සැපයීමට කටයුතු කරන ලදි. විශ්වවිද්‍යාලය 2014.11.03 දින අදාල භාණ්ඩ වලින් 30% ලද පසු භාණ්ඩ ඇනවුමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

4.2.2 ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා කල් බදු පදනම මත ගොඩනැගිලි ප්‍රසම්පාදනය.

(අ)	ශිෂ්‍යාවන් 250 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයීමේ අරමුණින් මඩකලපුව, තන්නමුනෙයි හි ශාන්ත ජෝශප් කාන්තා නිවාසයේ ගොඩනැගිල්ලක් කල්බදු පදනම මත විශ්වවිද්‍යාලය විසින් ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.		එකගවෙමි මඩකලපුවේ දියෝකීසියට අයිති ශාන්ත ජෝෂප් කාන්තා නිවස නමින් වන ගොඩනැගිල්ල/දේපල සිසුන් 250 කට නවාතැන් පහසුකම් ලබාගැනීම සඳහා කුලියට ලබාගන්නා ලදි. මෙවැනි සිසුන් ප්‍රමාණයකට එකවර නවාතැන් පහසුකම් සපයාගැනීම සඳහා සුදුසු ස්ථානයක් මෙම ප්‍රදේශයේ නොමැති විය. තක්සේරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වටිනාකම බිෂෝප් තුමා වෙත දන්වා සිටින ලද අතර ඔහු එම වටිනාකමට එකඟ නොවෙන ලදි. මේ සම්බන්ධව පාලක සභාවට දැනුම් දුන් අතර එහිදී ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කරනු ලබන ප්‍රාදේශීය ලේඛම් කොට්ඨාශය තුල වානිජ වටිනාකම ලබාගැනීමට තීරණය කරන ලදි. ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතික කිරීමට අනුව වානිජ වටිනාකම පුද්ගලයෙකු සඳහා රු. 2,000 ක් වූ අතර මෙය 2015.05.29 දින පැවති 253 වන පාලක සභා රැස්වීමේදී අනුමත කරන ලදි. නමුත් අප එහි වානිජ වටිනාකම වන රු. 2,000 × 250 = රු. 500,000.00 ට වඩා අඩු රු. 400,000.00 ක් පමණක් වන මාසික කුලියක් ගෙවීමට කටයුතු කර ඇත.
	(i)	තක්සේරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රක් තක්සේරුකරු විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවට අනුව, මෙම ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු. 170,000 ක් විය. කෙසේ වුවද දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වටිනාකම සැලකීමෙන් තොරව රු.400,000 ක මුදලක් මාසික කුලිය ලෙස විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිල්ල අයිතිකරුට සමාලෝචිත වර්ෂය තුළ රු.1,150,000 ක මුදලක් කුලී ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	
	(ii)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා යොදා ගැනීමට සුදුසු හා පිරිවැය ඵලදායි ගොඩනැගිල්ලක් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් රජයේ ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කර නොතිබිණි.	එකඟවෙමි පහත සඳහන් හේතු නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට නොහැකි විය. 1. සමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහල දමන ලදි. 2. මෙම සිසුන් සඳහා නේවාසික පහසුකම් අධ්‍යාපන අමාත්‍යංශය මගින් ඉදිකරමින් පැවති නව ශිෂ්‍ය නේවාසි-කාගාරවල ලබාදීමට විශ්වවිද්‍යාල සැලසුම් කලද, අදාල ඉදිකිරීම් කටයුතු අපේක්ෂිත කාල රාමුව තුල අවසන් නොකරන ලදි. 3. ඊලග ශිෂ්‍ය කණ්ඩායමද බඳවාගැනීම සඳහා සුදානම්ව පැවති බැවින් ඉහත සිසුන් සඳහා අධ්‍යාපන පාඨමාලා

		වහාම ආරම්භ කිරීමට තීරණය කරන ලදී.
(ආ)	ශිෂ්‍යාවන් 65 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයීමට මඩකලපුව, පුලියඩිකුඩා හි පිහිටි වෙනත් ගොඩනැගිල්ලක රු.130,000 ක මාසික කුලියකට 2014 මැයි 01 දින සිට ලබාගෙන තිබුණි. කෙසේ වුවද තක්සේරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් තක්සේරු-කරුගේ තක්සේරු වාර්තාවට අනුව, මෙම ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු.82,500 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිල්ලේ අයිතිකරුට රු.570,000 ක මුදලක් කුලී ලෙෂ වැඩිපුර ගෙවා ඇත.	එකඟවෙමි මඩකලපුවේ දියෝකීසියට අයිති මඩකලපුවේ, පාසිකුඩාහි ශාන්ත සෙබෙස්තියන් නේවාසිකාගාරය නමින් වන ගොඩනැගිල්ල/ දේපළ , සිසුන් 60 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයීමේ අරමුණින් කුලියට ගන්නා ලදී. මෙවැනි සිසුන් ප්‍රමාණයකට එකවර නවාතැන් පහසුකම් සපයා ගැනීම සඳහා සුදුසු ස්ථානයක් මෙම ප්‍රදේශයේ නොමැති විය. තක්සේරු දෙපාර්තමේ-න්තුවේ දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද්දේ ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් වූ අතර මෙය ඉඩමේ අයිතිකරු වූ බිෂෝප්තුමා වෙත දන්වා සිටියද ඔහු එම වටිනාකමට එකඟ නොවන ලදී. එබැවින් එය ප්‍රසම්පාදන කමිටුවට යොමු කරන ලද අතර අමතර වාරික මුදල වූ රු. 47,500.00 ක මුදල පහත කරුණු සැලකිල්ලට ගෙන අනුමත කරන ලදි. 1. ගෙවල් හිමියා විස්න් සපයන ලද ලී බඩු උපකරණ 2. බාස්කට් බෝල් ක්‍රීඩාංගණයක් පැවතීම. 3.අධ්‍යන ශාලා පහසුකම්

4.2.3 උප කුලපති නිල නිවස සඳහා විදුලි උත්පාදන යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීම

උප කුලපතිගේ නිල නිවසේ භාවිතය සඳහා රු.1,675,610 කට පුද්ගලික සමාගමකින් විදුලි උත්පාදන යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් මිලදී ගෙන තිබුණි. වගකීම් කාලය තුළ නොමිලයේ සේවා සැපයීම සඳහා සැපයුම්කරු එකඟවී තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් මෙම සේවය ලබාගෙන නොතිබූ අතර, විදුලි උත්පාදන යන්ත්‍රයේ අවිධිමත් නඩත්තුව හේතුවෙන් වගකීම් කාල පරිච්ජේදය තුළ මාස 2 කට වැඩි කාලයක් එම යන්ත්‍රය ක්‍රියා විරහිතව තිබුණි.	එකග නොවෙමි විදුලි උත්පාදන යන්ත්‍රය ක්‍රියාකාරී මට්ටමේ පවතින අතර ස්වයංක්‍රිය මාරුකිරීමේ ස්විචය පමණක් ක්‍රියාත්මක තත්වයේ නොපවතී. මේ පිළිබඳව සැපයුම්කරුට දැනුම්දීමෙන් අනතුරුව අදාල යන්ත්‍රය ඒවන විටත් වගකීම් කාලය තුල පැවති බැවින් නව පද්දතියක් ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු කරන ලදි.

4.2.4 විශ්ව විද්‍යාල පරිශ්‍රයේ බිම් දසුන් සැකසීම හා ගස් සිටුවීම

එවකට ජනාධිපතිවරයාගේ පැමිණීම හා විද්‍යා පීඨයේ ගොඩනැගිලි සංකීර්ණය විවෘත කිරීම සනිටුහන් කිරීම සඳහා විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණයේ ප්‍රධාන ප්‍රවේශය ඉදිරිපස බිම දසුන් සැකසීම හා ගස් සිටුවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 1,752,740 ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.	එකගවෙමි මෙම කොන්ත්‍රාත්තුව හිටපු ජනාධිපතිව-රයාගේ 2014.04.19 දින පැමිණීම සනිටුහන් කිරීම සඳහා ප්‍රධානය කරන ලදි. මෙය හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා සමග 2014.04.04 දින

<table>
<tr>
<td>(අ)</td>
<td>මෙම කාර්යය සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විවෘත තරගකාරි ලංසු පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව, 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ :ඍඔක* උපදේශක විසින් නිර්දේශ කරන ලද කොන්ත්‍රාත්කරු විශ්වවිද්‍යාල විසින් තෝරා ගෙන තිබුණි.</td>
<td rowspan="3">පැවති රැස්වීමකට අනුව ගනු ලැබූ තීරණයකට අනුව හා ඔහු විසින් උපදෙස් ලබාදුන් පරිදි සියළුම විශ්වවිද්‍යාලවල බිම් දසුන් සැකසිමේ ක්‍රියාකාරකම් අධීක්ෂණය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යංශය මගින් පත්කරනු ලැබ සිටි බිම් දසුන් සැකසීමේ උපදේශකවරයා විසින් නිර්දේශ කරන ලද රණමයුර බිම් දසුන් සැකසීමේ හා ගස් පිහිටුවීමේ සමාගම වෙත පහත හේතුද සැලකිල්ලට ගෙන ප්‍රධානය කරන ලදි.

1. මෙය විශේෂ කාර්යයක් වීම
2. හිටපු ජනාධිපතිවරයාගේ පැමිණීමට ඉතා කෙටි කාලයක් ඉතිරිව තිබීම
3. හිටපු ජනාධිපතිවරයාගේ පැමිණීම සිංහල / හින්දු අළුත් අවුරුදු සමයේ සිදුවූ බැවින් මෙම කාලවකවානුව තුල බොහෝමයක් සැපයුම්කරුවන් ඔවුන්ගේ ව්‍යාපාර වසා දමා තිබීම.
4. මඩකලපුව තුල ඉහත ගස් වර්ග සැපයීම සඳහා කිසිදු සැපයුම්කරුවෙකු නොමැතිවීම.

එබැවින් විවෘත මිල කැඳවීමක් සිදු කිරීමට නොහැකි විය.

විශ්වවිද්‍යාලයේ වැඩ ඉන්ජිනේරු හා උපදේශකවරයා විසින් ලංකා ඉන්ජිනේරු හා උපදේශන කාර්යාංශය මගින් ශ්‍රී.ලං.නැ.වි විද්‍යාලය තුල සමාන කාර්යයන් ඉටුකිරීමේදී ගෙයවන ලද රේටයන් පදනම් කරගෙන අදාල රේටයන් නිර්දේශ කරන ලදි.</td>
</tr>
<tr>
<td>(ආ)</td>
<td>2014 අප්‍රේල් 18 දින අදාළ කාර්යයන් කොන්ත්‍රාත්කරු විසින් ආරම්භ කර තිබුණද, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව :ඍජක* විසින් එම කොන්ත්‍රාත්කරු 2014 ජූලි 01 දින වැඩ නිම කිරීමෙන් පසුව තෝරාගෙන තිබුණි.</td>
</tr>
<tr>
<td>(ඇ)</td>
<td>සමාන වර්ගයේ පැල සඳහා වෙළඳපොළ පවත්නා හෝ වෙනත් සමාන සැපයුම්කරුවන්ගෙන් ලබාගත් රේටයන් සැලකීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රේටයන් පදනම් කරගෙන කොන්ත්‍රාත්කරුට රු.1,752,790 ක ගෙවීමක් කර තිබුණි.</td>
</tr>
</table>

<table>
<tr><td colspan="3">4.2.5 උපකුලපති නිල නිවස සඳහා ගෘහ භාණ්ඩ විෂයයන් මිලදී ගැනීම</td></tr>
<tr><td colspan="2">කෑම මේස, නිදන කාමර කට්ටල, යෝග්‍යතා උපකරණ, සෝපා කට්ටල, ඇඳන් හා පුටු ආදී ගෘහ භාණ්ඩ විෂයයන් රු. 1,447,873 ක වටිනාකමට 2013 මාර්තු 12 දින කොන්ත්‍රාත්කරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කිරීම වෙනුවට ඉහත සඳහන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා මොරටුව සැපයුම්කරුවකුගෙන් ලබාගත් වෙනස්කිරීම් කිහිපයක් සහිත කඩදාසියක වූ ව්‍යාජ මිල සැදහුමක් 2013 මාර්තු 12 දින උපකුලපතිවරයා විසින් අනුමත කර තිබුණි. තවද සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිලට අමතරව සියයට 10 ක ආන්තිකයක්ද ගෙවීම හේතුවෙන් විශ්ව විද්‍යාලයට රු. 131,625 ක පාඩුවක් සිදුවී තිබුණි</td><td>එකඟවෙමි

හිටපු උපකුලපතිවරයා පත්කිරීමෙන් අනතුරුව, උපකුලපති නිළ නිවසේ අළුත්වැඩියා කටයුතු අවසන් වන තෙක් මඩකළපුවේ, ත්‍රිකුණාමල පාරේ පිහිටි සංචාරක නිවසේ නවාතැන් ගන්නා ලදි. එසේම උපකුලපති නිළ නිවසේ තිබූ ලී බඩු උපකරණ ඉතා පරණ යල්පැනගිය ඒවා විය. උපකුලපති නිළ නිවසේ අළුත්වැඩියා කටයුතු අවසන් වූ වහාම උපකුලපතිවරයාට නිළ නිවසට අවශ්‍ය වූ බැවින් මෙම අළුත් හා නවීන ලී බඩු උපකරණ සැපයීමට කටයුතු කරන ලෙස අදාල සැපයුම්කරුට උපදෙස් ලබා දෙන ලදි</td></tr>
<tr><td colspan="3">4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා</td></tr>
<tr><td>(අ)</td><td>2014 ජූනි 24 දින පවත්වනලද විගණන කමිටු රැස්වීම අනුව, පරිගණක 155 ක් හා යූ-පී-එස් 06 ක් ප්‍රසම්පාදනය කිරීමේදී දරන ලද රු. 4,233,370 ක පාඩුව විශ්ව විද්‍යාලයේ නිළධාරින් 03 දෙනෙකුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසු වුවද ඉහත පාඩුව 2015 ජූනි 30 දක්වාත් අයකර ගෙන නොතිබුණි. එම කාරණය පිළිබඳ සිදුකරන ලද විනය පරීක්ෂණය සඳහා විමර්ශන නිළධාරියා විසින් කරන ලද නිර්දේශයන් හා ඉදිරිපත් කරන ලද වාර්තාව සඳහා අධ්‍යනයන් හා සමාලෝචනය කිරීමට සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කිරීමට තීරණය කළ බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා තිබුණි</td><td>එකඟ නොවෙමි

විගණන කමිටුවේ නිර්දේශය 2014.08.28 දින පැවති 247 වන පාලක සභා රැස්වීමට යොමුකරන ලද අතර එහිදී අදාප කරුණ සම්බන්ධයෙන් විනය පරීක්ෂණය පවත්වන ලද විමර්ශන නිළධාරියා විසින් ලබාදෙන ලද වාර්තාව අධ්‍යනය කොට අදාල නිර්දේශය සමාලෝචනය කිරීම සඳහා සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල වාර්ථාව බලාපොරොත්තුවෙන් පසුවේ</td></tr>
<tr><td>(ආ)</td><td>2012 ජූනි 23 අත්සන් කරන ලද ගිවිසුම අනුව, විශ්වවිද්‍යාලය, ත්‍රිකුණාමලය පීඨය හා සෞන්දර්යය අධ්‍යනය සඳහා ස්වාමි විපුලානන්ද ආයතනය ිඃඩ්ජ්* සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා උපදේශක කාර්යයන් 2012 අප්‍රේල් 16 දින සිට මාස 03 ක් ඇතුළත නිම කළ යුතු විය. කෙසේ වුවද එම කාර්යය 2015 ජූනි 30 වන විටත් නිමකර නොතිබුණි.</td><td>එකඟ නොවෙමි

අදාල උපදේශකවරුන් විසින් ශ්‍රී.ලං.නැ.වි විද්‍යාලය සඳහා පිළියෙල කරන ලද ප්‍රධාන සැලැස්මේ අවසාන කෙටුම්පත 2016.06.15 දින ලබාදීමට කටයුතු කරන ලද අතර විශ්ව විද්‍යාලයේ නිළධාරින් සඳහා ප්‍රදර්ශනය කිරීහුමට සැලසුම් කරන ලදි. සංශෝධන කිහිපයක් සිදු කිරීමට සිදුවීම හා අදාල අධිකාරීන් වෙතින් හිමිකම් ඔප්පු ලබාගැනීමේ කටයුතු කරගෙන යමින්</td></tr>
</table>

		පැවති බැවින් අදාල සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත් ඔවුන් 2012 නොවැම්බර් මස ප්‍රධාන සැලැස්මේ පළමු ඉදිරිපත් කිරීමෙන් සංශෝධන කිහිපයකට පසු 2013 මැයි මස 20 වන දින දෙවන ඉදිරිපත් කිරීමෙන් ත්‍රිකුණාමල මණ්ඩපය හා ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යාලයද ඇතුලත් සියළුම පරිශ්‍රයන් සඳහා ඉදිරිපත් කරන ලදි.
(ඇ)	ශිෂ්‍යත්ව මත විදේශගත වූ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 74 දෙනෙකු ශිෂ්‍යත්ව සම්පූර්ණ රිරීමෙන් පසුව රාජකාරි සඳහා වාර්තා කර හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත් වී නොතිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් කථිකාචාර්යවරුන් 74 දෙනෙකුගෙන් එකතුව රු. 160,937,945 ක මුදලක් අයකර ගැනීමට 2015 ජුනි 30 වන විටත් විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණි. ගිවිසුම් කඩකල 44 දෙනෙකුගෙන් සිද්ධීන් 12 ක් සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා ලැබිය යුතු මුදල ඔවුන්ගෙන් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට භාරදී ඇති බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා ඇත.	අර්ධ වශයෙන් එකඟවෙමි • ගිවිසුම් කඩකල 74 දෙනෙකු ඇතුලත් නඩු 12 ක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සහ ගිවිසුම් කඩකල අයගෙන් අදාල මුදල් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. රජයේ නීතිඥවරුන් දෙදෙනෙකු විසින් අදාල නඩු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. අදාල ගිවිසුම් කඩකල අයගෙන් රුපියල් මිලියන 9.7 කට ආසන්න මුදලක් මේවන විටත් අයකර ගැනීමට කටයුතු කර ඇත. • වසර 10 කට වඩා පැරණි නඩු සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කල නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. කෙසේ වෙතත් සභාපති/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ලේකම් / උසස් අධ්‍යාපන අමාත්‍යංශය මාර්ගයෙන් වසර 10 කට වඩා පැරණි නඩු සලකා බලන ලෙස ඉල්ලා නීතිපතිවරයා වෙත ඉල්ලීමක් යොමු කර ඇත. • නීතිපති වරයාගෙන් කිසිදු යහපති ප්‍රතිචාරයක් මේ දක්වා ලැබී නොමැත. 2014.12.31 දිනට වර්තමාන ගිවිසුම්ගත වටිනාකම වන්නේ; මුළු ගිවිසුම් වටිනාකම - රු. 160,541,597.43 මුළු ආපසු අයකරගැනීම් - රු. 10,190,871.88

(ඉ)	ශිෂ්‍යත්ව මත විදේශගත වන කථිකාචාර්යවරුන්ගෙන් නිවාඩු අනුමත කිරීමට පෙර අත්තිකාරම් අයකර ගත යුතුය. කෙසේ වුවද බැඳුම්කර ගිවිසුම් කඩකල කථිකාචාර්යවරුන් 05 දෙනෙකගෙන් එකතුව රු. 204,551 ක හිඟ අත්තිකාරම් ශේෂයන් අයකර ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යත්ව සඳහා නිවාඩු ලබාදී තිබුණි.	එකඟ නොවෙමි ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ 12 වන පරිච්ඡේදයෙහි 15:10:1 වගන්තිය ප්‍රකාරව වගන්තියෙහි පැහැදිලිව සඳහන් කර ඇත්තේ "කිසියම් නිළධාරියෙකු විසින් විදේශ රටක සේවා නියුක්තිය සඳහා වැටුප් රහිත නිවාඩු ඉල්ලුම් කිරීමේදී අදාල නිවාඩු ලබා දීමට පෙර සියළු ණය ගෙවා නිරවුල් කල යුතුය." එය වැටුප් සහිත නිවාඩු සමග අධ්‍යන නිවාඩු ලබා ගන්නි ගුරුවරුන් සඳහා අදාල නොවේ
(ඊ)	1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 72(1) වගන්තිය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21.1.1 වගන්තිය අනුව ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා කථිකාචාර්ය තනතුරක (පරිවාස) කථිකාචාර්යවරයකු විසින් වර්ෂ 08 ක් ඇතුලත පශ්චාත් උපාධිය සම්පූර්ණ කල යුතුය. කෙසේ වුවද නිශ්චිත කාල පරිච්ඡේදය තුල පශ්චාත් උපාධිය සම්පූර්ණ නොකල කථිකාචාර්යවරුන් 17 දෙනෙකු තාවකාලික කථිකාචාර්යවරුන් ලෙස ඔවුන් ආපසු එම තනතුරුවලට යැවීමෙන් තොරව ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය ලෙස උසස්වීම් ලබාදී තිබුණි.	එකඟ වෙමි මෙම ප්‍රදේශය තුල 2008 වර්ෂයට පෙර පැවති වාතාවරණය අනුව අදාල කථිකාචාර්ය වරුන් සඳහා උසස්වීම් ලබා දී ඇත. මෙම කාලවකවානුව තුල ඔවුන්ට පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය ලබා ගත නොහැකි වූ අතර ඒ හේතුවෙන් ඔවුන්ට අදාල කාලසීමාව තුල අදාල පාඨමාලා අවසන් කර ගත නොහැකි විය. එසේම විශ්ව විද්‍යාලයේද මෙම කාල වකවානුව තුල ජ්‍යේෂ්ඨ කාර්යයමණ්ඩලයේ හිගයකට මුහුණ පා තිබුණි. එබැවින් පාලක සභාවේ අනුමැතිය මත ඔවුන් සඳහා උසස්වීම් ලබා දී ඇත.
(උ)	සමාලෝචිත වර්ෂය තුළ රු. 13,399,453 ක් වැය කරමින් විශ්වවිද්‍යාලයේ අමුත්තන්ගේ නිවාසයේ පැරණි ගොඩනැගිල්ලක් අළුත් වැඩියා කර තිබූ අතර මෙම ගොඩනැ-ගිල්ලෙන් ඉවත් කරන ලද විදුලි පංකා, විදුලි පහන්, විදුලි උත්පාදන යන්ත්‍ර හා ස්විචස් ආදී වටිනා භාණ්ඩ 2012 අගෝස්තු 30 දින විශ්ව විද්‍යාලයේ විදුලි කාර්මිකට භාරදී තිබුණි. කෙසේ වුවද, උප කුලපති නිල නිවසේ පවත්වා ගෙන යන ඉන්වෙන්ට්‍රි ලේඛණයේ මෙම විෂයයන් ඇතුලත් කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.	එකඟ නොවෙමි අදාල භාණ්ඩ නැතිවී නොමැති අතර ඒවා විදුලි කාර්මික විසින් නඩත්තු දෙපාර්තමේන්තුවට භාර දීමට කටයුතු කර ඇති අතර දැනට විශ්ව විද්‍යාලයේ පවතී. සමහර විදුලි පංකා අළුත්වැඩියා කර ශිෂ්‍ය නිවාස වල අළුතින් සවිකර ඇත. විදුලි ජනන යන්ත්‍ර සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යාපීඨයේ ප්‍රයොජනයට ගනිමින් පවතී. අදාල භාණ්ඩ උපකුලපති නිළ නිවසට අයත් නොවන අතර ඒවා පාලන අංශයේ සංචාරක නිවාසයට අයත් ඒවා වේ.

(ඌ)	එවකට සිටි උප කුලපතිවරයා 2015 මාර්තු 05 සිට බලපැවැත්වෙන පරිදි විශ්ව විද්‍යාලයෙන් ඉවත්වී තිබුණි. ඔහුගෙන් අයවිය යුතු රු. 45,182 ක ණය ශේෂ අයකර ගැනිමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොමැත.	එකඟ නොවෙමි එවකට සිටි උප කුලපතිවරයාගේ ප්‍රමාණවත් විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් පවතින අතර අදාල ණය ශේෂය ඔහු විසින් විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීමේ ලියවිලි භාරදුන් පසු අයකරගැනීමට කටයුතු කරනු ලැබේ.
4.4 මානව සම්පත් කළමණාකරණය		
විශ්වවිද්‍යාලයේ පීඨ පහක් ර්යවරු ඇතුලත් ප්‍රධාන අධ්‍යයන තනතුරු 23 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 64 කින් ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය හා කථිකාචාර්ය තනතුරු 41 ක පුරප්පාඩු පැවතුණි. කෙසේ වුවද 2015 ජූනි 30 දක්වාත් මෙම තනතුරු පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.		අර්ධ වශයෙන් එකඟ වෙමි පුරප්පාඩු වී ඇති තනතුරු වලින් සමහරක් පිරවීම සඳහා 2014 දෙසැම්බර් මස පුවත්පත් දැන්වීම් පලකල අතර පාලක සභාව පත් නොකිරීම, 2015 ජනාධිපතිවරණය පැවැත්වීම වැනි හේතුමත වැඩිදුර ක්‍රියාමාර්ග ගත නොහැකි විය. සියළුම අධ්‍යන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා මේවන විටත් කටයුතු කරමින් පවතී.
4.5 වත්කම් කළමණාකරණය		
''පටක සකස් කිරීම පිළිබඳ උපාංග අටක් '' නම් වූ වෛද්‍ය උපකරණය රුපියල් මිලියන 4.5 ක පිරිවැයකට 2012 වර්ෂය තුළ ප්‍රසම්පාදනය කර තිබුණද, පටක සකස් කිරීම් උපකරනයේ ප්‍රධාන කොටස මිලදී ගැනීමට නොහැකිවීම හේතුවෙන් එය මිලදී ගත් දින සිටම සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ නිෂ්කාර්යව පැවතුනි.		අර්ධ වශයෙන් එකඟ වෙමි පටක සැකසුම් ඒකකයේ කොටසක් මයික්‍රොටෝමයක් (අන්වීක්ෂයක කදාව සඳහා පිළියෙල කරන ලද පටක කැපීමට භාවිතා කරන උපකරණය) සමග සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ මනෝ භෞතිකවේද අධ්‍යනාංශයේ ප්‍රයෝජනයට ගත හැකි විය. එසේම ඒකකයේ අනෙකුත් කොටස් විද්‍යා /කෘෂිකර්ම පීඨයේ ඇති වෙනත් මයික්‍රොටෝමයක් සමග ප්‍රයෝජනයට ගත හැකි බවට යොජනා වී තිබේ. අවශ්‍ය-තාවය අනුව මෙම අයිතම අනෙකුත් පීඨ වලට මාරුකර යැවීමට කටයුතු කරනු ලැබේ. පටක සැකසුම් යන්ත්‍රය සඳහා මේ දක්වා ගෙවීම් කර නොමැත.

5. ගිණුම් කටයුතුභාවයහා යහ පාලනය	
5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම	
2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.	එකඟ වෙමි 2014 වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස් කිරීම 2015 මාර්තු මස 10 වන දිනට අවසන් කරන ලදි. 2015 මාර්තු මස 05 වන දින සිට ශ්‍රී.ලං.නැ.වි විද්‍යාලයේ ප්‍රධාන විධායක නිළධාරියකු නොමැති විය. නව උපකුලපතිවරයෙකු පත්කරන තෙක් වැඩ බලන ලේඛකාධිකාරීවරයාට උපකුලපති තනතුරේ දෛනික කටයුතු පිළිබඳව සොයාබලන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ඉල්ලීම් කර තිබුණි. 2015 අප්‍රේල් මස 02 වන දින නිසි බලධාරියෙකු පත්කරන ලද අතර වෙනත් කිසිදු විකල්පයක් නොමැති හෙයින් වැඩබලන මූල්‍යාධිකාරී විසින් අත්සන් කරන ලද අවසන් ගිණුම් 2015 මාර්තු මස 11 වන දින මඩකලපුවේ විගණන කාර්යාලය වෙත භාරදීම කරන ලදි. කෙසේ වෙතත් දින 10 ක ප්‍රමාදයක් පවතින බව අප පිළිගනිමු. නිසි බලධාරියා පත්කිරීමෙන් අනතුරුව 2015.05.29 දින පාලක සභාවේ ප්‍රථම රැස්වීම (253 වැනි) පවත්වන ලද අතර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා ගිණුම් අනුමත කරන ලදි.
5.2 අභ්‍යන්තර විගනණය	
කාර්යක්ෂම හා ඵලදායි ආකාරයෙන් අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට ස්ථිර හා පලපුරුදු කාර්යය මණ්ඩලයක් පත් කර නොතිබුණි.	එකඟ නොවෙමි ශ්‍රී.ලං.නැ.වි විද්‍යාලයේ අභ්‍යන්තර විගණන ඒකකය අත්දැකීම් බහුල සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු ආරම්භයේ සිට ලබා දී ඇති අතර, කාර්යය මණ්ඩල ප්‍රතිපාදනයක් සහිත සහය කාර්යය මණ්ඩලයක සහයෝගය ඇතිව කාර්යක්ෂමව කටයුතු කරනු ලබයි. ශ්‍රී.ලං.නැ.වි විද්‍යාලයේ ව්‍යාප්තිය සහ වැඩ ප්‍රමාණය ඉහලයාම නිසා අතිරේක කාර්ය මණ්ඩල ප්‍රතිපාදන මේ වන විටත් වි.වි.ප්‍ර.කො. සභාවට යෝජනා කර ඇත.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම	
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා 4.2.3 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 3 ක කාලච්ඡේදයක් ඇතුලත සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුලත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	එකඟ වෙමි සම්ප්‍රදායක් ලෙස වර්ෂයක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. කෙසේ වෙතත් 2015 වර්ෂයේ සිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කරනු ලැබේ.
5.4 අයවැය පාලනය	
අයවැයගත සහ සත්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	ප්‍රධාන විචල්‍යන් සඳහා හේතු වූයේ; 1. විශේෂ දීමනා සහ 20% අතිරේඛ විශේෂ දීමනා ගෙවීම. 2. විදුලිය, ජලය, ප්‍රවාහනය සහ කුලී ගාස්තු යනාදී උපයෝගී සේවා ගාස්තු ඉහල යාම. 3. උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ උපදෙස් මත ප්‍රමාණවත් නේවාසිකාගාර සඳහා ලී බඩු උපකරණ මිලදී ගැනීම. 4. ජංගම නොවන වත්කම් මත ක්ෂය හා ක්‍රමක්ෂය වැනි මූල්‍ය නොවන අයිතම වල වටිනාකම් ඉහල යාම.
6. පද්දති හා පාලනය	
විගණනයේදී නිරීක්ෂණය වූ පද්ති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ. (අ) ගිණුම්කරණය (ආ) වත්කම් කළමණාකරණය (ඇ) ණය සහ අත්තිකාරම් අයකර ගැනීම (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය (ඉ) මානව සම්පත් කළමණාකරණය	සටහන් කර ගතිමි

ආචාර්ය ටී ජයසිංගම්
උප කුලපති